# උපාසක වත

(භික්ෂූන් වහන්සේලාගේ පහසුව පිණිස
ගිහි පින්වතුන් විසින් දැනගත යුතු විනය කරුණු)

2025 / 2568

සංස්කරණය

පූජ්‍ය ගල්පොතුගොඩ ඤාණවංස හිමි

# උපාසක වත

(භික්ෂූන් වහන්සේලාගේ පහසුව පිණිස ගිහි පින්වතුන් විසින් දැනගත යුතු විනය කරුණු)

සංස්කරණය - පූජ්‍ය ගල්පොතුගොඩ ඤාණවංස හිමි

ප්‍රථම මුද්‍රණය - 2025

ISBN-978-624-6357-13-9

විමසීම් - අමිල ප්‍රියංකර මහතා 0701705165

## ධර්ම දානය පිණිස යි.

ප්‍රකාශනය - ථේරවාද ප්‍රකාශන සමිතිය
සද්ධාතිස්සාරාම මහාවිහාරය,
මඩගම්මන මාවත, කටුකැලියාව,
අනුරාධපුරය.
theravadapublications@gmail.com

මුද්‍රණය - පාරමී ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්
නො. 235/1, වැලිපිල්ලෑව, ගණේමුල්ල.
දුරකථනය : 071 300 80 50
ඊමේල් : parameepub@gmail.com

# පිටු පෙළගැස්ම

පෙරවදන ............................................................ iv
හැඳින්වීම............................................................ vi
පුණ්‍යානුමෝදනාව ............................................................ x
උපකාර කරගත් ග්‍රන්ථ............................................................xii
1. ආහාර සම්බන්ධයෙන් දත යුතු කරුණු........................1
1.1 පිළිගැනීම ............................................................1
1.2 කාලික විභාගය ............................................................10
1.3 සන්නිධිකාරකය............................................................13
1.4 අෂ්ඨපාන ගිලන්පස............................................................15
1.5 ගිලන්පස සඳහා නුසුදුසු ගෙඩි වර්ග ..................16
1.6 උණුවෙන් සාදා ගන්නා ලද ගිලන්පස................17
1.7 චතුමධුර............................................................17
1.8 විකාලභෝජනය ............................................................18
1.9 අරුණ සහ මධ්‍යාහ්නය ............................................................19
1.10 ආහාර පවාරණය ............................................................20
1.11 ආහාර කප්පියං (කැප) කිරීම.............................23
1.12 කැප අකැප මත්ස්‍ය මාංශ ..................................25
1.13 ආහාර පිසීම............................................................26
2. මුදල් සම්බන්ධයෙන් දත යුතු කරුණු ...................... 26
2.1 මුදල් පූජා කිරීමේ දී කළයුතු දේ........................27
2.2 කැපකරුවෙක් හරහා අවශ්‍ය දේ මිල දී ගැනීම............................................................28
2.3 පොදු පරිහරණය සඳහා මුදල් පූජා කිරීම .........29
2.4 අමතක වූ මුදලකට කළ යුතු දේ........................29

2.5 අකැප භාණ්ඩ හුවමාරුව ....................................29

2.6 කැප භාණ්ඩ හුවමාරුව ......................................... 31

2.7 රන් රිදී මුතු මැණික්.............................................32

2.8 අනාමර්ශ වස්තු..................................................32

3. සිවුරු සම්බන්ධයෙන් දත යුතු කරුණු ..................... 34

3.1 සිවුරේ පැහැය ......................................................35

3.2 සිවුරේ ප්‍රමාණය ...................................................35

3.3 සිවුරුවල කඩ කැපීම ...........................................37

4. පාත්‍ර සම්බන්ධයෙන් දත යුතු කරුණු.........................39

4.1 පාත්‍රයේ ප්‍රමාණය ................................................. 40

5. පාවහන් සම්බන්ධයෙන් දත යුතු කරුණු ..................41

7. සයනය කිරීම පිළිබඳ දත යුතු කරුණු ...................... 43

7.1 පිරිමින් සිටින නිවසක සයනය කිරීම.................43

7.2 කාන්තාවන් සිටින නිවසක සයනය කිරීම ....... 44

7.3 දිවා සයනය ..........................................................46

7.4 භික්ෂූන් උදෙසා ආසන පැණවීම .......................47

8. භික්ෂූන් හමුවට පැමිණෙන ගිහි පින්වතුන් දත යුතු කරුණු ..................................................................................... 47

8.1 කාන්තාවන් සමග හුදකලා වීම ..........................47

8.2 කාන්තාව භික්ෂුවගේ කය ස්පර්ශ කිරීම ............48

8.3 කාන්තාවන් සමග සංවිධානය වී ගමන් යෑම....49

8.4 ගිහි පින්වතුන් සෙනසුනක දී හැසිරිය යුතු ආකාරය ...........................................................................49

9. පොළොව කැණීම සහ ගස් කැපීම සම්බන්ධයෙන් දත යුතු කරුණු..............................................................51

9.1 පොළොව කැණීම...................................................51

9.2 ගස් කැපීම ...........................................................51

10. බෙහෙත් සම්බන්ධයෙන් දත යුතු කරුණු .............. 54
10.1 ඉල්ලීම............................................................54
11. සඟසතු පිරිකර සම්බන්ධයෙන් දත යුතු කරුණු ....56
11.1 ගරු භාණ්ඩ .......................................................56
11.2 ලහු භාණ්ඩ .......................................................57
11.3 සඟසතු දේපල පරිභෝගය .................................58
11.4 අපවත් වූ භික්ෂුවකගේ පිරිකර ..........................58
12. වස් ආරාධනය සහ කඨිනය සම්බන්ධයෙන් දත යුතු කරුණු ..............................................................59
12.1 වස් ආරාධනාව..................................................59
12.2 වස් ආරාධනයෙන් පසු කළ යුතු වත්පිළිවෙත් .............................................................60
12.3 කඨින චීවර පූජාව .............................................61
13. වන්දනා කිරීම පිළිබඳ දත යුතු කරුණු .................. 62
13.1 වන්දනා නො කළ යුතු අවස්ථා ...........................63
14. ධර්මශ්‍රවණය සම්බන්ධයෙන් දත යුතු කරුණු ........63
14.1 කාන්තාවන්ට ධර්මය දේශනා කිරීම ..................63
14.2 ධර්ම ගෞරවයෙන් දහම් ඇසීම..........................64
15. දන්දීම සම්බන්ධයෙන් දත යුතු කරුණු.....................67
15.1 අටපිරිකර .........................................................67
16. නොමනා ගිහියන්ට බුදුන් වහන්සේ පණවා ඇති දඬුවම ...................................................................68

# පෙරවදන

චිරං තිට්ඨතු ලොකස්මිං සම්මාසම්බුද්ධසාසනං!

සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහල වන්නේ අති දීර්ඝකාලයක් පාරමීදම් මුදුන් පමුණුවාගෙන වන අතර ඒ නම් සොළසාඞ්ඛෙය්‍ය කල්ප ලක්ෂයක්, අෂ්ඨාසඞ්ඛෙය්‍ය කල්ප ලක්ෂයක්, හෝ සාරාසඞ්ඛෙය්‍ය කල්ප ලක්ෂයක් ආදී වශයෙනි. මෙසේ අතිදීර්ඝ කාලපරාසයකින් පසු මෙලොවට දායාද වන ලොවුතුරු දහම සමස්ථ ලෝකවාසී සත්ත්වයනට ම නිවන පිණිස පවති.

සම්බුද්ධ ශාසනය මත පිහිටා කටයුතු කරන බුද්ධ පුත්‍රයන් වහන්සේලාට මෙන් ම ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට ද ඉතාමත් අගේ කොට සැලකිය හැකි “උපාසක වත” නම් මෙම ගතට පෙරවදනක් සපයා දීම භාග්‍යයක් කොට සලකමි. මන්දයත් තථාගත සම්බුදු සසුනේ චිරස්ථිතිය සිවුවනක් පිරිස මත රැඳී ඇති බැවිනි.

සිවුවනක් පිරිසේ ක්‍රියාකාරකම් මත ශාසන ප්‍රතිපදාව ගිලිහී නො යෑමට ලෝකනාථයන් වහන්සේ මිණිවැලක් අමුණන්නාක් මෙන් විනය සිකපදයන් පෙන්වා දෙන ලදී. එය සම්බුදු සසුනේ ආයුෂය යි.

සසුන් ගුණපුරන්නවුන් මෙන් ම එයට බැස ගන්නා උවැසි උවැසියන්ටත් තම ගුණයන් පුරාගනුවස් පෙලදහමට අටුවා ටීකාවනට අනුව “උපාසක වත” නම් මෙම ගත ඉතාමත් උචිත අයුරින් සකසා දෙනුයේ පන්දහසක් කල් ලෝදම් බැබළීම පිණිස ය. වර්තමානයේ ගිලිහී යන චර්යා ධර්මයන් විනය කාරනා මෙම ගතින් සකසා ගැනීමට මනා ව ඉවහල් වේ.

තථාගත පරිනිර්වාණයෙන් වසර 2600 පමණ ගෙවී ඇතත් අද දක්වාත් සසුන බැබළෙන්නේ සුපේශල ශික්ෂාකාමී යතිවරු නිසා ම ය.

එවන් යතිවර පරපුරක් යටතේ ස්වකිය පැවිදි දිවිය ආලෝක කරගනිමින් තමාත් බැබැළී සිවුවනක් පිරිස ද බබළවමින් සම්බුදු සසුන ආලෝකමත් කිරීමට ගන්නා ලද මෙම උත්සහය ඉතාමත් අගනේ ය.

බොහෝ කලක් බුරුම රට ධර්මය හදාරමින් තම නැණ ඔප්නන්වාගත් පූජ්‍ය ගල්පොතුගාඩ ඤාණවංස ආයුස්මතුන්ට මෙම කුසලය නිවන පිණිස ම හේතු වේවා!

මෙම කටයුත්ත සාර්ථක කරගැනීමට උරදුන් සැමටත් මෙත් සිතින් ආශීර්වාද කරමි.

මෙයට,

මෙතැති,



**පහලවිටියල ජනානන්ද මහා ස්ථවිර**
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ සම්මාන අනුනායක
මහෝපාධ්‍යාය, ශාසන කීර්ති ශ්‍රී පටිපත්ති ශෝභන
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධානාචාර්ය හා
ප්‍රධාන අනුශාසක

# හැඳින්වීම

මෙම සම්බුද්ධ ශාසනයේ ඇති උපසම්පදා ශීලය වනාහි එහි පිහිටන කුලදරුවනට ලෞකික ලෝකෝත්තර සකල සම්පත්තීන් ම සාදා දීමට සමත්, වටිනාකම පමණ කළ නො හැකි, අතිඋත්තම අතිදුර්ලභ වස්තුවෙකි. එබැවින් දිව්‍යසම්පත්තීන් වැනි මහත් සම්පත් ඇති මහරජවරු ද රජකම්වලට හිමිකම් ඇති රජපුත්හු ද අපරිමිත ධනසම්පත් ඇති මහසිටුහු ද සිටුපුත්හු ද රජසම්පත් සිටුසම්පත් හැර පැවිදි වූහ. ඒ උපසම්පදා ශීලය, ශීලයන් අතුරෙන් අග්‍රශීලය වේ. එබැවින් එයට 'අධිශීලය'යි ද කියනු ලැබේ. එය රක්ෂා කරන තැනැත්තා ආපායිකාදී දුක්බයන්ගෙන් හා අත්තානුවාදාදී භයින් ද මුදවන බැවින් 'ප්‍රාතිමෝක්ෂ සංවරශීලය'යි ද කියනු ලැබේ. එහි අනුසස් නො අඩුව ලැබීමට එය නො නැසෙන පරිදි, සිදුරු නො වන පරිදි, පළුදු නො වන පරිදි රැකිය යුතු ය. එය මැනවින් රැකිය හැකි වීමට එයට අයත් ශීලාංගයන් දත යුතුය.

ඉහත කියන ලද අකාලික ශාසනය වනාහි භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවනක් පිරිසට නිවන් අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලසෙන ඒකායන මාර්ගය යි. එහි දී භික්ෂුවිනය සේ ම ගිහිවිනයත් ඇත. භික්ෂූන් ගිහිපින්වතුන් සමග ද ගිහිපින්වතුන් භික්ෂූන් සමග ද ආශ්‍රය නිශ්‍රය කිරීමේ දී කළ යුතු හා නො කළ යුතු දෑ (චාරිත්‍ර වාරිත්‍ර) පිළිබඳ බෞද්ධයන් වශයෙන් දැන ගැනීම ඉතා වැදගත් වේ. එසේ දැන ගැනීම අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශීලය රකින භික්ෂූන් වහන්සේලාගේ නිවන් ගමන පහසු කරන්නේ මෙන් ම, නිවන් ගමන ඉක්මන් කරන්නා වූ මහඟු උපකාරයකි.

නිවනින් නිවිය හැක්කේ කුසලයක් උපදවා ගෙන මිසක අකුසල් රැස් කරගෙන නොවේ. වර්තමාන කාර්ය

බහුල සමාජීය තත්ත්වයන් මත ශාසනික චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ බොහෝ ගිහියෝ සේ ම ඇතැම් භික්ෂූන් වහන්සේලා ද තැකීමක් නො කරති. ඔවුන්ගේ මතය වන්නේ කාලය ට අනුව සියලු දේ ම වෙනස් වන බව යි. නමුත් ඔවුන් නො දන්නා කරුණ නම් සම්බුද්ධ ශාසනය සහ බුද්ධ දේශිත සද්ධර්මය සෑම කල්හි ම වලංගු වන අතර විනය ශාසනයේ ආයුෂය වන බව ය.

මෙකල විනය රකින්නෝ අල්ප ය. භාග්‍යවතුන් වහන්සේ මේ කරුණු අනාගතයේ දී වන බව දන්නා නිසාවෙන් සෑම කාලයට ම අදාළ ව විනය සික්ෂා පැණවූ සේක. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත සද්ධර්මය මුඛ පරම්පරාගත ව පැමිණීමෙන් පසු ව ගන්ථාරූඪ වූයේ එහි කිසිදු වෙනසක් සිදු නො කර ය. එසේ නිර්මල ව නිවැරදි ව සිදු කළේ එතෙක් කල් නො කිළිටි ව රහතන් වහන්සේලා විසින් එය පරපුරෙන් පරපුරට ගෙන එන ලද බැවිනි. එනමුදු වර්තමාන සමහර භික්ෂූන් වහන්සේලා විසින් ඒ නිර්මල ධර්මය විකෘති කිරීමට පටන්ගෙන ඇත. විනය සික්ෂාපදයන් එදා මෙන් අදත් අපහසුවකින් තොර ව රැකිය හැකි බව විනය රකින්නෝ දනිති.

අපගේ අඩුපාඩු ව නම් ඒවා හරිහැටි නො දැන අකුසල් රැස්කර ගැනීම යි. ඊට අමතර ව එම නො දැනුවත්කම නිසා ම භික්ෂූන් වහන්සේලාට ද නොයෙක් අපහසුතාවයන්ට මුහුණ පාන්නට සිදු වී ඇත. එවන් පසුබිමක සරල ව ගිහිපින්වතුන් විසින් දැනගත යුතු විනය කරුණු පිළිබඳ මනා ව දැනගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට මෙම ග්‍රන්ථය මහෝපකාරී වනු ඇතැයි විශ්වාස කරමි.

මෙය හැකිතාක් සරල ව ලිවීමට අදහස් කළේ සියලු දෙනාට ම එක සේ වටහා ගැනීමට පහසු වීම පිණිස යි. තැන් කිහිපයක රූප සටහන් යෙදුවේ ද

සුඛාවබෝධය පිණිස ම ය. එය කාටත් පහසුවක් වේ යැයි සිතමි.

එමෙන් ම මෙහි ඇතුළත් කරුණු විනය පිටකයෙන් උපුටා ගත් කරුණු ය. මෙහි පාලිය ඇතුළත් නො කළේ ග්‍රන්ථය මහත් වන නිසාවෙනි. පාලිය ඇතුළත් නො කලත් එහි අර්ථයට හානියක් නොවන සේ හැකිතාක් සරළ කොට ඇතුළත් කළේ කියවන්නන් හට පහසුවෙන් අවබෝධ වීම පිණිස ම යි. මෙහි ඇති කරුණු පිළිබඳ යම් කෙනෙකුට සැකයක් ඇත්නම් ත්‍රිපිටකයෙන් බලා සැක තැන් දුරු කරගත හැක. එම කරුණු උපුටාගත් ග්‍රන්ථයන් සැකෙවින් මාතෘකා පිළිවෙළින් මෙහි දක්වා ඇත.

මෙම ග්‍රන්ථය සංස්කරණය කිරීම සඳහා ආරාධනා කළ පින්වත් එම්. ජී අමිල ප්‍රියංකර මහතාටත් පින්වත් ජනක රංග මහතාටත් මෙම පුණ්‍ය කර්මය හේතුවෙන් සසර ජයගෙන උතුම් නිවනින් සැනසෙන්න ලැබේවා.

මෙම ග්‍රන්ථය සැකසීමෙහිලා සෝදුපත් බලමින් උපකාර කළා වූ පූජ්‍ය බද්දේගම වජිරනන්ද ස්වාමින් වහන්සේට ද, පූජ්‍ය මහව ඤාණාලෝක ස්වාමින් වහන්සේට ද, පූජ්‍ය කඩුවෙල අතුලඤාණ ස්වාමින් වහන්සේට ද, පූජ්‍ය පූජාපිටියේ සූරියරතන ස්වාමින් වහන්සේට ද, පූජ්‍ය කටුවන ධම්මසාර ස්වාමින් වහන්සේට ද උපකාර කළ අනෙකුත් සියලු ම ස්වාමින්වහන්සේලාට ද මෙම කුසලය නිවන් පිණිස ම හේතු උපනිශ්‍රය වේවා. මෙම ග්‍රන්ථය සඳහා සිතුවම් නිර්මාණය කළ පින්වත් කේ. වයි. ඩිලේඛා සචිනි මධුමාලි සහෝදරියටත් මේ පින නිවන් පිණිස ම හේතු උපනිශ්‍රය වේවා.

එසේ ම මේ සඳහා තවත් සෝදුපත් බැලීම් ආදියෙන් උපකාර කළා වූ පින්වත් මැණියන් ඇතුළු සියලු ම ගිහි පින්වතුන්ටත් මුද්‍රණ දායකත්වය දැරූ

සියලු ම දෙනාටත් මුද්‍රණාලයාධිපති තුමන් ඇතුළු සියලු ම කාර්ය මණ්ඩලයටත් මෙම කුසලය අනුමෝදන් කරමි, අනුමෝදන් වේවා. එමගින් සසර ජයගෙන උතුම් නිවනින් සැනසීම පිණිස ම මෙම කුසලය හේතු උපනිශ්‍රය වේවා.

සෑම දෙනාට ම සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් යන සතර මගඵලවලට පැමිණීමට මෙම ග්‍රන්ථය හේතු උපකාර වේවා.

තෙරුවන් සරණ ම වේවා!

මෙයට,
ග. ඤාණවංස හිමි.

# පුණ්‍යානුමෝදනාව

● "සාගාරා අනගාරා ච -උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා,
ආරාධයන්ති සද්ධම්මං - යොගක්ඛෙමං අනුත්තරං."

"ගිහි පින්වතුන් ද, පැවිදි උතුමන් ද යන දෙපක්ෂය ඔවුනොවුන් ඇසුරු කිරීම නිසාවෙන් (ප්‍රතිපත්ති-ප්‍රතිවේධ) සද්ධර්මය ද, අරිහත්වය සහ නිවන ද සම්පාදනය කෙරෙත්."

● "සාගාරෙසු ච චීවරං - පච්චයං සයනාසනං,
අනාගාරා පටිච්ඡන්ති - පරිස්සයවිනොදනං."

"පැවිදි උතුමෝ ගිහි පින්වතුන්ගෙන් පීඩා උපද්‍රව දුරු කරන සිවුරු ය, සෙනසුන් ය, පිණ්ඩපාත ය, ගිලන්පස ය යන ප්‍රත්‍යය ද පිළිගනිත්."

(ඛුද්දකනිකායො/ බහුකාරසුත්තං)

"භික්ෂූන් වහන්සේලාගේ පහසුව පිණිස ගිහි පින්වතුන් විසින් දැන ගත යුතු කරුණු" යන මැයෙන් "උපාසක වත" නමින් වටිනා දහම් පුස්තකයක් සම්පාදනය කළ, ගෞරවනීය ගල්පොතුගොඩ ඤාණවංස ස්වාමීන් වහන්සේට නිදුක් නිරෝගී සුව දිගාසිරි පිණිසත්, පාරමී පුරමින් පතන්නා වූ බෝධියකින් අසඞ්ඛත වූ නිර්වාණ ධාතුව අවබෝධය පිණිසත්, මෙම ධර්ම දානමය කුසලය හේතු උපනිශ්‍රය ම වේවා!

මේ උතුම් දහම් පුස්තකය සඳහා දායකත්වය දැරූ මේ සඳහා නන් අයුරින් දායක වෙමින්, උපකාර කළ සෑම සියලු දෙනාගේ පවුල්වල සුජීවත් ව සිටින දෙමාපිය ආදී ඥාතීන්ට ද, නමින් මිය පරලොව ගිය සියලු ම ඥාතීන්ට ද, මෙම උතුම් කර්තව්‍යයට සම්බන්ධ වන්නට හැකි වූ අපට ද, ලෝකවාසී සියලු සත්ත්වයන්ට ද ප්‍රාර්ථනීය බෝධිවලින් වහ වහා උතුම් නිවනින් නිවීම පිණිස ම, මෙම උතුම් ධර්ම දානමය කුසලය හේතු වාසනා වේවා!

මෙම දහම් පුස්තකය මුද්‍රණය කරන්නට දායක වූ "පාරමී මුද්‍රණාලයේ" අධිපතිතුමා ඇතුළු එහි කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ද, ධර්මාවබෝධය පිණිස ම මෙම උතුම් කුසලය හේතු වාසනා වේවා!

මෙයට ශාසනාලයැති,
අමිල ප්‍රියංකර.

## ධර්ම දානය

### "සබ්බදානං ධම්මදානං ජිනාති"

ධර්මදානය තෙම සියලු ආමිස දානය පරදව යි.

ජී.ඒ. සිරිමාවතී, ජී.ඒ. කරුණාදාස, ජී.ඒ. අමරාවතී, ජී.ඒ. ධර්මදාස, ජී.ඒ. ආරියදාස, නිලූකා දමයන්ති, ඉනෝකා අත්තනායක, නදීකා අත්තනායක, ගයාන් අත්තනායක, ඉන්දික අත්තනායක, රසික රත්නායක, ජී.ජී කුසුමාවතී, චන්ද්‍රාණී ගුණවර්ධන, රජිතා විජේසේකර, රොෂාන් හපුආරච්චි, අයෝමා ප්‍රියන්ති, තුෂාරි මුණසිංහ, ප්‍රියංකා පීරිස්, ඉනෝකා සංජීවනී, බුද්ධික රණතුංග, දිලානි විමලරත්න, සම්පත් කස්තුරිරත්න, තනූජා ගුණසිංහ, Tran Thuy Linh, Le Phuong Tu, Nguyen Khanh Phuong, Phạm Thị Hà, Nguyễn Thu Hà, Thảo Đường (Vietnam) සහ ථේරවාද ප්‍රකාශන සමිතිය.

**නිබ්බානස්ස පච්චයෝ හෝතු !!!**

# උපකාර කරගත් ග්‍රන්ථ

මෙම ග්‍රන්ථය සකස් කිරීමේ දී උපකාර කරගත් ග්‍රන්ථ සහ එම කරුණු සඳහන් ග්‍රන්ථය දළ වශයෙන් පහත දක්වා ඇත. පාලි වාක්‍යයන් ඒ ආකාරයෙන් ම මෙහි නො යෙදුවත් එහි අදහස වෙනස් නොවන සේ යෙදීමට මහන්සි ගතිමි.

1. ආහාර සම්බන්ධයෙන් දැනගත යුතු කරුණු

1.1 පිළිගැනීම

විනයපිටකය, පාචිත්තියපාළි, දන්තපෝන සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

1.2 කාලික විභාගය

විනයපිටකය, මහාවග්ගපාළි අට්ඨකථා, චතුමහාපදේසකතා ඇසුරින් සකස් කරන ලදී.

1.3 සන්නිධිකාරකය

විනයපිටකය, පාචිත්තියපාළි, සන්නිධිකාරක සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

1.4 අජ්ඨපාන ගිලන්පස

විනයපිටකය, මහාවග්ගපාළි, කේණියජටිලවත්ථු.

1.5 ගිලන්පස සඳහා නුසුදුසු ගෙඩි වර්ග

විනයපිටකය, මහාවග්ග අට්ඨකථා, භේසජ්ජක්ඛන්දකය.

1.6 උණුවෙන් සාදා ගන්නා ලද ගිලන්පස

විනයපිටකය, මහාවග්ග අට්ඨකථා, භේසජ්ජක්ඛන්දකය.

1.8 විකාලභෝජනය

විනයපිටකය, පාචිත්තියපාළි, විකාලභොජන සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

1.9 අරුණ සහ මධ්‍යාහ්නය

විනයාලංකාර ටීකාව

1.10 ආහාර පවාරණය

විනයපිටකය, පාචිත්තියපාළි, පඨමපවාරණ සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

1.11 ආහාර කප්පියං (කැප) කිරීම

විනයපිටකය, පාචිත්තියපාළි, භූතගාම සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

1.12 කැප අකැප මත්ස්‍ය මාංශ

විනයපිටකය, මහාවග්ගපාළි, භේසජ්ජක්ඛන්දකය.

1.13 ආහාර පිසීම

විනයපිටකය, මහාවග්ගපාළි, භේසජ්ජක්ඛන්දකය, අන්තෝවුත්ථාදිපටික්ඛේපකථා.

2. මුදල් සම්බන්ධයෙන් දත යුතු කරුණු

2.1 මුදල් පූජා කිරීමේ දී කළයුතු දේ

2.2 කැපකරුවෙක් හරහා අවශ්‍ය දේ මිලදී ගැනීම

2.3 පොදු පරිහරණය සඳහා මුදල් පූජා කිරීම

ඉහත මාතෘකා තුන විනයපිටකයේ එන රාජසික්ෂාපදය, රූපියසික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

2.4 අමතක වූ මුදලකට කළ යුතු දේ

විනයපිටකය, පාචිත්තියපාළි, රතන සික්ෂාපදය.

2.5 අකැප භාණ්ඩ හුවමාරුව

විනයපිටකය, පාරාජිකපාළි, රූපියසංවෝහාර සික්ෂාපදය.

2.6 කැප භාණ්ඩ හුවමාරුව

විනයපිටකය, පාරාජිකපාළි, කයවික්කය සික්ෂාපදය.

2.8 අනාමර්ශ වස්තු

විනයපිටකය (ටීකා), විනයසඞ්ගහ-අට්ඨකථා, අනාමාස විනිච්ඡයකථා.

3. සිවුරු සම්බන්ධයෙන් දත යුතු කරුණු 33

3.1 සිවුරේ පැහැය

විනයපිටකය, මහාවග්ගපාළි, චීවරක්ඛන්දකය.

3.2 සිවුරේ ප්‍රමාණය

විනයපිටකය, පාරාජිකපාළි, පඨමකඨිනසික්ෂාපදය.

3.3 සිවුරු වල කඩ කැපීම

විනයපිටකය, මහාවග්ගපාළි, චීවරක්ඛන්දකය.

4. පාත්‍ර සම්බන්ධයෙන් දත යුතු කරුණු

4.1 පාත්‍රයේ ප්‍රමාණය

විනයපිටකය, පාරාජිකපාළි, ඌනපඤ්චබන්ධන සික්ෂාපදය.

5. පාවහන් සම්බන්ධයෙන් දත යුතු කරුණු

විනයපිටකය, මහාවග්ගපාළි, චම්මක්ඛන්දකය, නීලාදිපටික්ඛෙපො.

6. කුඩ සම්බන්ධයෙන් දත යුතු කරුණු

විනයපිටකය, පාචිත්තියපාළි (භික්ඛුනීවිභඞ්ගය), ඡත්තුපාහනවග්ගය, පඨමසික්ෂාපදය.

7. සයනය කිරීම පිළිබඳ දත යුතු කරුණු

7.1 පිරිමින් සිටින නිවසක සයනය කිරීම

විනයපිටකය, පාචිත්තියපාළි, පඨමසහසෙය්‍ය සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

7.2 කාන්තාවන් සිටින නිවසක සයනය කිරීම

විනයපිටකය, පාචිත්තියපාළි, දුතියසහසෙය්‍ය සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

7.3 දිවා සයනය

විනයපිටක (ටීකා), විනයාලඞ්කාර-ටීකා, දිවාසෙය්‍යවිනිච්ඡයකථා

8. භික්ෂූන් හමුවට එන ගිහි පින්වතුන් දත යුතු කරුණු

8.1 කාන්තාවන් සමග හුදකලා වීම

විනයපිටකය, පාචිත්තියපාළි, රහොනිසජ්ජ සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

8.2 කාන්තාවක් භික්ෂුවකගේ කය ස්පර්ශ කිරීම

විනයපිටකය, පාරාජිකපාළි, කායසංසග්ග සික්ෂාපදය.

8.3 කාන්තාවන් සමග සංවිධානය වී ගමන් යෑම

විනයපිටකය, පාචිත්තියපාළි, සංවිධාන සික්ෂාපදය.

9. පොළොව කැණීම සහ ගස් කැපීම සම්බන්ධයෙන් දත යුතු කරුණු.

9.1 පොළොව කැණීම

විනයපිටකය, පාචිත්තියපාළි, පඨවිඛණන සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

9.2 ගස් කැපීම

විනයපිටකය, පාචිත්තියපාළි, භූතගාම සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

10. බෙහෙත් සම්බන්ධයෙන් දත යුතු කරුණු

විනයපිටකය, පාචිත්තියපාළි, මහානාම සික්ෂාපදය.

11. සඟසතු පිරිකර සම්බන්ධයෙන් දත යුතු කරුණු

11.1 ගරු භාණ්ඩ

විනයපිටකය, පාරාජිකපාළි

11.4 අපවත් වූ භික්ෂුවකගේ පිරිකර

විනයපිටකය, මහාවග්ගපාළි, චීවරක්ඛන්ධකය, මතසන්තකකථා.

12. වස් ආරාධනය සහ කඨිනය සම්බන්ධයෙන් දත යුතු කරුණු

12.1 වස් ආරාධනාව

විනයපිටකය, පාරාජිකපාළි, පඨමකඨින සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

12.3 කඨින චීවර පූජාව

විනයපිටකය, පාරාජිකපාළි, පඨමකඨින සික්ෂාපදය සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

13. වන්දනා කිරීම පිළිබඳ දත යුතු කරුණු

13.1 වන්දනා නො කළ යුතු අවස්ථා

විනයපිටකය, පරිවාරපාළි

14. ධර්මශ්‍රවණය සම්බන්ධයෙන් දත යුතු කරුණු

14.1 කාන්තාවන් හට ධර්මය දේශනා කිරීම

විනයපිටකය, පාචිත්තියපාළි, ධම්මදේසනා සික්ෂාපදය.

14.2 ධර්ම ගෞරවයෙන් දහම් ඇසීම

විනයපිටකය, පාචිත්තියපාළි, සේඛියා සහ එහි අට්ඨකථාව ඇසුරින් සකස් කරන ලදී.

16. නොමනා ගිහියන්ට බුදුන් වහන්සේ පණවා ඇති දඬුවම

විනයපිටකය, චුල්ලවග්ගපාළි, ඛුද්දකවත්ථුක්ඛන්ධකය.

මෙයට අමතරව මෙම ග්‍රන්ථයන්ගෙන්ද යම් යම් කරුණු සහ අදහස් ගන්නා ලදී.

උපසම්පද ශීලය - පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහනාහිමි

ශාසනාවතරණය - පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහනාහිමි

බෞද්ධයාගේ අත්පොත - පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහනාහිමි

වහලය ගලවන්න - පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමි

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

# උපාසක වත

"විනයෝ නාම බුද්ධසාසනස්ස ආයු, විනයෙ ඨිතෙ සාසනං ඨිතං හෝති."

පාරාජිකකණ්ඩ-අට්ඨකථා/ ගන්ථාරම්භකථා

"බුදුසසුනේ ආයුෂය විනය යි. විනය ඇති කල්හි සාසනය ද පිහිටන ලද්දේ වෙයි."

භික්ෂූන් වහන්සේලාගේ විනය ආරක්ෂා කරගැනීමට උපකාරයක් වීම පිණිස ගිහිපින්වතුන් විසින් ද දැනගත යුතු විනය කාරණා බොහෝමයක් ඇත. මෙම කාරණා නිසියාකාර ව තේරුම් ගෙන සංඝෝපස්ථානය මැනවින් සිදුකර නිවන් මග එළි කර ගැනීමට මෙම පොත උපකාරයක් වේවා!

## 1. ආහාර සම්බන්ධයෙන් දත යුතු කරුණු

### 1.1 පිළිගැනීම

භික්ෂූන් වහන්සේලාට පිළිගැනීමකින් තොර ව වැළඳිය හැක්කේ ජලය සහ දැහැටි පමණි.

පිළිගැනීම යනු යම් අනුපසම්පන්නයෙකු[1] කෑමට ගන්නා දෙයක් ඔසවා උපසම්පදා භික්ෂුවක් ඉදිරියට පැමිණ වීම යි. එය කයින් හෝ කය සම්බන්ධ දෙයකින් භාරගෙන (පිළිගෙන) භික්ෂුවට පරිභෝග කළ හැකි ය. එය පිළිගැනීම යැයි කියනු ලැබේ.

යම්කිසි ආහාරයක්, බෙහෙතක් හෝ යම්කිසි ගිලින දෙයක් භික්ෂුවකට තමන් විසින් ම රැගෙන අනුභව

---

1 අනුපසම්පන්නයා නම් උපසම්පදාව නො ලැබූ සාමණේර හෝ ගිහි පින්වතුන්.

කිරීමට විනයෙන් කැප නැත. එය පිළිගත් විට පමණක් භික්ෂුවට කැප වේ. එසේ පිළිගැනීම කළ හැක්කේ උපසම්පදා භික්ෂුවකට පමණි. අනුපසම්පන්නයා විසින් කළ හැක්කේ පිළිගැන්වීම පමණි. එසේ පිළිගන්වන විට "මෙම ආහාරය භික්ෂුවකට වේවා" කියා භික්ෂුවක් ඉදිරියේ තැබීමෙන් පිළිගැනීම සිද්ධ නොවේ. එම ආහාරය හෝ ගිලින දෙය භික්ෂුවගේ අතට හෝ කය සමග සම්බන්ධ වූ දෙයකට පිළිගැන්වීම කළ යුතු යි. කය සමග සම්බන්ධ වූ දෙයක් නම් පාත්‍රයක් වැනි දෙයක් ය. මීට අමතර ව භික්ෂුව තමා ඉදිරියේ ඇති මේසයක් වැනි දෙයක් (මධ්‍යම පුරුෂයා[2]ට එසවිය හැකි බරක්) පිළිගැනීමේ අදහසින් අල්ලාගෙන සිටින විට එය මත පිළිගැන්විය යුතු ආහාර ආදිය තැබීමෙන් පිළිගැනීම සම්පූර්ණ වේ. හුදෙක් වචනයෙන් ප්‍රකාශ කිරීම පිළිගැන්වීම නොවේ. පිරිකරක් සඟසතු කොට පූජා කලත් එහි ආහාරයක් ඇත්නම් අතට දෙනතෙක් භික්ෂුවකට රැගෙන පරිභෝග කළ නො හැකි ය. උපසම්පදා භික්ෂුවක් විසින් තවත් උපසම්පදා භික්ෂුවකට පිළිගැන්වීම කළ නො හැකි ය. එක් භික්ෂුවක් පිළිගත් දෙය සියලු ම භික්ෂූන් වහන්සේලාට කැප වේ.

මෙසේ පිළිගැන්වීමේ දී සැලකිය යුතු කරුණු 5ක් ඇත.

1. පිළිගන්වන්නා හා පිළිගැනීම කරන භික්ෂුව අතර ඇති දුර ප්‍රමාණය පිළිගැන්වීමේ දී දත යුතු ප්‍රධාන කරුණකි. බොහෝ දෙනෙකු මෙම කාරණය පිළිබඳ මනා දැනුමක් නොමැතිකමින් භික්ෂුව අපහසුතාවයන්ට පත් වේ. පිළිගන්වන

2 සාමාන්‍යයෙන් උස මහත ඇති නිරෝගී පුද්ගලයෙක්

අනුපසම්පන්නයා භික්ෂූන් වහන්සේගේ අත්පස සිටිය යුතු ය. අත්පස යනු දෙදෙනා අතර ඇති දෙරියන්හමාරක (රියන්[3] දෙකහමාරක) දුර ප්‍රමාණය යි. එයට වඩා දුර සිට පිළිගැන් වූ දෙය භික්ෂුව විසින් පිළිගත්ත ද එම පිළිගැනීම සාර්ථක නොවේ. එසේ පිළිගත් දෙය අනුභව කිරීමෙන් ඇවතට[4] පත් වේ. එම නිසා පිළිගන්වන පුද්ගලයා හා පිළිගන්නා භික්ෂුව අතර දුර ප්‍රමාණය දෙරියන්හමාරකට වඩා දුර නො විය යුතු ය. භික්ෂුව සිටින තැන හා ඉරියව්ව අනුව මෙම දෙරියන්හමාර ගන්නා ආකාරය වෙනස් වේ.



රියන් 2 1/2

3 රියන යනු අතේ වැලමිටේ පටන් මැදගිල්ලේ කෙළවරට ඇති දුර ප්‍රමාණය යි. මෙය ඉදිරියේ එන “සිවුරේ ප්‍රමාණය” යන මාතෘකාව යටතේ විස්තර වේ.

4 ඇවැත් යනු භික්ෂු ව්‍යවහාරයේ එන සික්ෂාපද කැඩීමට කියන තවත් නමකි.

භික්ෂුව සිටගෙන සිටින විට එය ගණන් ගනු ලබන්නේ භික්ෂුවගේ පිටුපස සිට පිළිගන්වන පුද්ගලයාගේ ශරීරයේ ඉදිරිපස වෙත යි. ගිහි පුද්ගලයා හෝ සාමණේරයා විසින් ඉදිරියට නැමී පිළිගැන්වීමේ දී ඒ පුද්ගලයාගේ දික්කළ අත හැර ඉදිරියට පැමිණි ශරීරයේ භික්ෂුවට ආසන්න ම තැන තෙක් මෙම දෙරියන් හමාර ගණන්ගනු ලැබේ.




රියන් 2 1/2


භික්ෂුව වාඩි වී සිටින විට කෙනෙකු භික්ෂුවකට යමක් නැමී පිළිගන්වන විට ඔහුගේ උරහිස ඉදිරියට නැමීම නිසා භික්ෂුවට සමීප වන්නේ පිළි-ගන්වන්නාගේ උරහිස් ප්‍රදේශයෙනුයි. එවිට භික්ෂුවගේ පිළිගන්වන පුද්ගලයාට ඇති ආසන්නම කොටස සම්බන්ධ වන ස්ථානයේ පිටුපස සිට ඒ පුද්ගලයාගේ හිස දක්වා ඇති දුර දෙරියන් හමාරට අඩු විය යුතුය. මෙම පින්තූරයේ හැටියට භික්ෂුවගේ ආසන්නම කොටස වන්නේ පාදය යි. එම පාදය සම්බන්ධ වන

ශරීරයේ පිටුපස සිට ගැනිය යුතු ය. භික්ෂුවගේ හිස ඉදිරියට නැමී ඇත්නම් හිසේ පිසුපස සිට ගැනිය යුතු ය. අත හො පය යන අංගයන් මෙම පිළිගැනීමේ අත්පස පිළිබඳ සැලකීමේ දී ප්‍රධාන ශරීරාංගයක් හැටියට නො ගැනේ. ඒ අතර දුර ප්‍රමාණය එයිට වඩා වැඩි වුව හොත් පිළිගැනීම සිද්ධ නොවේ. සමහර පුද්ලයන් භික්ෂූන් වහන්සේගේ සමීපයට නො ගොස් දුර සිට අත් දිගුකර පිළිගැන්වීම කරයි. එසේ කිරීමෙන් පිළිගැන්වීම සිදු නොවේ.


යම් අවස්ථාවක අත්පසට යෑමට නොහැකි වන සේ භික්ෂුව හා පිළිගන්වනු ලබන පුද්ගලයා අතර යම් (මේසයක් වැනි) බාධාවක් ඇත්නම් දෙදෙනාම ඉදිරියට නැමී භික්ෂුවගේ කොන්ද පිටුපස සිට පිළිගන්වනු ලබන පුද්ගලයාගේ හිසට ඇති දුර රියන් දෙකහමාරට අඩු වන සේ පිළිගත හොත් එම පිළි ගැනීම සාර්ථක වේ.



එසේ ම භික්ෂුව උස් තැනක සිටිනා විට අනුපසම්පන්නයෙක් පහළ සිට යමක් පිළිගන්වන්නේ නම් එහි අත්පස ගණින් ගැනෙන්නේ භික්ෂුවගේ පතුලේ කෙළවර සිට බිම සිටින පුද්ගලයාගේ හිස වෙත යි. ඒ අතර ඇති දුර ප්‍රමාණය රියන් දෙකහමාරට වඩා අඩු විය යුතු යි. ඊට වඩා වැඩි වුව හොත් පිළිගැනීම සිදු නොවේ.




එසේ ම භික්ෂුව බිම සිට, පිළිගන්වනු ලබන පුද්ගලයා උස් තැනක සිටින්නේ නම් එහි අත්පස ගැනෙන්නේ උඩින් සිටින ගිහි පුද්ගලයාගේ පතුලේ පටන් භික්ෂූන් වහන්සේගේ හිස පිටුපස තෙක් ය. ඒ අතර දුර ප්‍රමාණය රියන් දෙක හමාරට වඩා අඩු විය යුතුයි. එසේ නො වුව හොත් පිළිගැනීම සිදු නොවේ.



රියන් 2 1/2

භික්ෂූන් වහන්සේ නමක් නිදාගෙන සිටින විට යම් කෙනෙක් යමක් පිළිගැන්වීමේ දී එහි අත්පස ගැනෙන්නේ භික්ෂුවගේ පිටුපස සිට පිළිගන්වනු ලබන පුද්ගලයාගේ ශරීරයේ ආසන්නයට ම පැමිණෙන කොටස වෙත යි. ඒ අතර දුර ප්‍රමාණය රියන් දෙක හමාරට වඩා අඩු විය යුතු යි.

එම නිසා පිළිගැන්වීමේ දී දෙදෙනා අතර ඇති දුර ගැන වඩාත් සැලකිලිමත් විය යුතු ය.

මෙම අත්පස නිවරදිව සැකයකින් තොරව අවබෝධ කරගැනීමට මෙකල භික්ෂූන් වහන්සේලා අනුගමනය කරන ක්‍රමය නම් භික්ෂුවගේ අත දිගහැර පිළිගන්වන පුද්ගලයාගේ නහය ඇල්ලීමට හැකිවන තරම් දුරකින් සිට දානය පිළිගැනීම යි. මෙය සිටගෙන පිළිගැනීමේ දී වඩාත් නිවැරදි වේ.

2. පිළිගන්වනු ලබන දෙය මධ්‍යම ප්‍රමාණයේ කායබල[5]

---

5 සාමාන්‍යයෙන් උස මහත ඇති නිරෝගී පුද්ගලයෙකි.

ඇති පුද්ගයෙකුට එසවිය හැකි ප්‍රමාණයේ දෙයක් වීම මීලඟ කාරණය යි. මධ්‍යම ප්‍රමාණයේ පුද්ගලයෙකුට එසවීමට නො හැකි දෙයක් දෙතුන් දෙනෙකු එකතු වී ඔසවා පිළිගැන්වුව ද එම පිළිගැනීම සාර්ථක නොවේ. නමුත් මධ්‍යම ප්‍රමාණයේ පුද්ගලයෙකුට එසවිය හැකි දෙයක් දෙතුන්දෙනෙකු හෝ ඊට වඩා පිරිසක් විසින් ඔසවා පිළිගැන්වුව ද පිළිගැනීම සාර්ථක වේ. එසේ පිළිගැන්වීමේ දී එක් පුද්ගලයෙකු හෝ භික්ෂුවගේ අත්පස සිටිය යුතු ම ය. දානමය පින්කම්වල දී දානය පූජා කිරීම පහසුවට හෝ ඉක්මනට කිරීමට පිරිස එකතු වී මේසය පිටින් ඔසවා පූජා කරන අවස්ථා ඇත. එසේ පූජා කිරීමේදී මේ ගැන සැළකිලිමත් විය යුතු ය. මේසයත් සමග ඇති ආහාර ද්‍රව්‍ය මධ්‍යම ප්‍රමාණයේ පුද්ගලයෙකුට තනි වම එසවීමට නො හැකි නම් එකින් එක භික්ෂුවට පිළිගැන්විය යුතු ය. නැත්නම් පිළිගැනීම අසාර්ථක නිසා භික්ෂුවට ඇවැත් විය හැක.

3. මීළඟ කාරණය නම් පිළිගන්වන ලද දෙය භික්ෂුව වෙත එළවිය[6] යුතු ය. යම් කෙනෙක් යමක් බන්දේසියක (වැනි දෙයක) තබා ගෙනවිත් පිළිගැන්වුවොත් භික්ෂුවට එම බන්දේසියෙන් ගත නො හැක. මුළු බන්දේසිය ම පිළිගෙන එහි ඇති දේ ගැනීම එහි ක්‍රමය යි. එසේත් නැති නම් එක් අතකින් බන්දේසියට අත තබා බන්දේසිය පිළිගෙන අනෙක් අතෙන් එහි ඇති දේ ගත හැකි ය. යම් කෙනෙක් භික්ෂූන් වහන්සේ කෙනෙකුට ගිලන්පසක් ආදිය පිළිගැන්වීමේ දී ගෙවල්වල

6 පිළිගැන්වීමට ආසන්නයට ගොස් නැඹුරු විය යුතුය.

ආගන්තුකයන් හට තේ බෙදන ආකාරයට නො කර, (බන්දේසිය) ට්‍රේ එකෙන් කෝප්පය ගෙන භික්ෂුවගේ අතට ම පිළිගන්වන්නේ නම් එය භික්ෂුවට පහසුවකි.

4. පිළිගන්වන ලද දෙය අනුපසම්පන්නයා විසින් අතින් හෝ අතේ ඇති හැඳි ආදී දෙයකින් දීමෙන් හෝ මුදා හැරිය යුතු ය. පිළිගන්වන ලද දෙය අනුපසම්පන්නයාගේ හෝ සාමණේරයාගේ සන්තකයේ තිබෙන තාක් පිළිගැනීම සාර්ථක නොවේ. එය කයින් හෝ කයට සම්බන්ධ දෙයකින් පිළිගන්වන ලද පුද්ගලයාගේ පක්ෂයෙන් මුදාහැරීම සිදු කළ යුතු ය.

5. අවසන් කාරණය වන්නේ එසේ මුදාහළ දෙය භික්ෂුවගේ අතින් හෝ කය සම්බන්ධ දෙයකින් භාරගත යුතු ය. උදාහරණයක් ලෙස අනුපසම්පන්නයා විසින් හැන්දකින් බෙදන විට එය අතින් හෝ ඔඩොක්කුවේ ඇති පාත්තරයෙන් හෝ පිළිගත යුතු ය.

මෙම කාරණා 5 සම්පූර්ණ වීමෙන් පිළිගැන්වීම සාර්ථක වේ. අනුපසම්පන්නයා විසින් මේ කාරණා පිළිබඳ මනා ව දැනුවත් වී පිළිගැන්වීම සිදු කරන්නේ නම් භික්ෂූන් වහන්සේට කිසිදු සැකයකින් තොර ව ආහාරපාන ගත හැකි ය.

තවත් විස්තර කරන්නේ නම් භික්ෂුවගේ පිළිගැනීමේ අපේක්ෂාව ඇත්නම් පිළිගන්වන්නා විසින් එම පිළිගන්වන දෙය භික්ෂුවගේ අතේ තැබුව ද ශරීරයේ අන්තැනක තැබුව ද පිළිගැනීම සිද්ධ වේ. භික්ෂුවගේ ශරීරය හා සම්බන්ධ අන්කිසිවක තැබුව ද පිළිගැනීම සාර්ථක ය. යම් භික්ෂුවක් සමීපයේ

භාජනයක් තබා එය අඩු ම තරමින් ඉඳිකටුතුඩක් තරමවත් භික්ෂුවගේ ශරීරයේ ගෑවෙන්නේ නම් එම භාජනයට ඇමුව ද පිළිගැනීම සිද්ධ වේ. භික්ෂුවක් ඇඳක් මේසයක් පුටුවක් අල්ලාගෙන සිටින විට එහි තබන ලද දෙයත් පිළිගන්නා ලද්දේ වෙයි. සැලකිය යුතු කරුණක් නම් වෙනස් කිරීමට නො හැකි වනසේ පිහිටුවා ඇති කොන්ක්‍රීට් (ස්ථාවර) මේස ආදියේ හෝ ගලක හෝ තැබීමෙන් පිළිගැනීම සාර්ථක නොවේ.

එක් භික්ෂුවක් වැටක් ලෙස ගසා ඇති ඇලක් අසලට පැමිණි විට අනෙක් පසින් අනුපසම්පන්න කෙනෙක් පැමිණ පිළිගැන්වීමේ දී ඇල අසළට දෙදෙනාගේ ම පැමිණීම නිසා අත්පස නිවැරදි ය. එවැනි අවස්ථාවල දී දෙදෙනා ම අත්පස සිට අනුපසම්පන්නයා විසින් ඇලෙන් එහා පැත්තට වීසි කිරීමෙන් පිළිගැන්වීම කළ හැකි ය. ඇලෙන් එහා පැත්තේ සිටින භිකෂුව විසින් එය අල්ලා ගැනීමෙන් පිළිගැනීම සාර්ථක වේ.

මෙසේ පිළිගැනීම සාර්ථක ව කෙරුණේ නම් එම වස්තුව සියලු ම උපසම්පදා භික්ෂූන් වහන්සේලාට කැප ය. පිළිගැනීම අසාර්ථක වුව හොත් එය සියලු ම භික්ෂූන් වහන්සේලාට අකැප ය. යමක් පිළිගැන්වීමට පෙර භික්ෂුව එසවූයේ නම් ඒ දෙය ද සියලු ම භික්ෂූන් වහන්සේලාට අකැප ය. ඉහත කී පිළිගත් දෙය භික්ෂූන් වහන්සේලා පරිභෝග කර අවසන් වන තෙක් නැවතත් අනුපසම්පන්නයන් විසින් ඇල්ලීම යෝග්‍ය නොවේ.

## 1.2 කාලික විභාගය

භික්ෂුව ආහාරයට ගන්නා සියලු ම දේ කාලික[7]

---

7 කාලයට අයත් යන අර්ථය දෙයි. ඒ ඒ කාලයට අයත් ආකාරය අනුව යාවකාලික ආදිය දැනගත යුතු යි.

සතරකට වෙන් කර දක්වා ඇත. එය ගිහියන් විසින් ද අවබෝධ කරගෙන සිටින්නේ නම් භික්ෂූන් වහන්සේගේ පහසුව පිණිස හේතු වේ.

එම කාලික සතර නම් යාවකාලික, යාමකාලික, සත්තාහකාලික සහ යාවජීවික යි.

යාවකාලිකය යනු අරුණ උදාවේ පටන් මධ්‍යාහ්නය[8] දක්වා පමණක් අනුභව කිරීමට හැකි ආහාර පානාදිය යි. ආහාර සංඛ්‍යාවට යන සියලු ම දේ අපට ගත හැක්කේ ඉහත කී කාලය තුළ දී ය. එනම් ධාන්‍ය වර්ග, කැඳ, බත්, කිරි, මස්, මාළු, ව්‍යංජන වර්ග, කැවිලි, පළතුරු වර්ග ආදිය යි. තවත් බොහෝ දේ මෙම යාවකාලික ගණයට ගැනේ. මෙහි ලක්ෂණය නම් ආහාර පිණිස ගන්නා බව යි. මෙම යාවකාලික වස්තූන් කියන ලද කාලයෙන් පිටත පිළිගැනීම හෝ භික්ෂුව සන්තකයේ තබා ගැනීම කළ නො හැක. එසේ තබා ගත්තත් පරිභෝගයට ගැනීම කිසිසේත් ම කළ නො හැක. එම නිසා යාවකාලික දේ එම කාලයේ පමණක් පිළිගැන්වීමට අනුපසම්පන්නයා විසින් දැනගත යුතු ය.

යාමකාලිකය නම් අරුණේ පටන් පසුදා අරුණ දක්වා අතර කාලය තුළ තබා ගෙන පරිභෝගයට ගත හැකි දේවල් ය. එයට අෂ්ඨපාන[9] ආදී පළතුරු ගිලන්පස ඇතුළත් වේ. අෂ්ඨපාන හෝ එයට අනුලොම්[10] වන පළතුරු සිසිල් ජලයෙන් මිරිකා පෙරා සකස්කර මෙම කාලය තුළ පානය කළ හැක. නමුත් මෙසේ පළතුරු යූෂ සකස් කිරීම උපසම්පදා භික්ෂුව විසින් කළ නො

8 අරුණ හා මධ්‍යාහ්නය ගැන ඉදිරියේ විස්තර වේ.

9 අෂ්ඨපාන පිළිබඳ ඉදිරියේ විස්තර වේ.

10 ආසන්න වශයෙන් සමාන වන

හැක. එසේ භික්ෂුවක් විසින් සකස් කරගන්නේ නම් යාවකාලිකයට ඇතුළත් වේ. එනම් මධ්‍යාහ්නයට පෙර අවසන් කළ යුතු ය. නමුත් අනුපසම්පන්නයෙකු විසින් පළතුරු මිරිකා යුෂ පෙරා පිළිගන්වන්නේ නම් එය පසු දා අරුණ දක්වා තබාගෙන පානය කළ හැක. අරුණට පෙර අවසන් කළයුතු ය. නැත හොත් අත්හළ යුතු ය. (අනුපසම්පන්නයෙකුට දීම හෝ අපේක්ෂාවක් නොමැතිව අත් හැරිය යුතු ය.)

සත්තාහකාලිකය නම් දින සතක් භික්ෂුව සන්තකයේ තබාගෙන පරිභෝග කළ හැකි දේවල් ය. ගිතෙල්, තලතෙල් ආදී තෙල් වර්ගත් මීපැණි, උක්සකුරු, බටර් සහ ඒවාට අනුලෝම් වන සීනි ආදී සියලු ම දේ මෙම ගණයට ඇතුළත් වේ. උදාහරණයක් ලෙස බටර්, ගිතෙල්, මීපැණි, සකුරු යොදා සකස් කරන චතුමධුර[11] දවස් 7ක් තබා ගෙන පරිභෝග කළ හැකි ය. අටවන දවසේ අරුණ උදාවට මත්තෙන් අවසන් කිරීම හෝ අත්හැරීම කළ යුතු ය. මේවා දායකයන් විසින් පූජා කිරීමේ දී භික්ෂුවගේ අතට පිළිනොගන්වා ආරක්ෂිත තැනකින් තැබීමෙන් හෝ කැපකරුවෙක්හට භාරදීමෙන් භික්ෂුවට අවශ්‍ය වේලාවට පිළිගන්වාගෙන වැළඳිය හැක.

යාවජීවක නම් එක් වරක් පිළිගෙන ජීවිතාන්තය දක්වා තබාගෙන පරිභෝග කළ හැකි දේවල් ය. ඉහත කී කාලික තුනට ඇතුළත් නොවී ඉතිරි වූ සියලු ම දේවල් යාවජීවක වේ. එනම් කෝපි, තේ, අරළු, බුළු, නෙල්ලි, බෙලිමල්, රණවරා, පොල්පලා, ඉරමුසු, කොත්තමල්ලි, වෙනිවැල්ගැට, සුදුළූණු ආදී සියලු ම ඖෂධයන් ය. ඒවා එක් වරක් පිළිගෙන දිවි ඇති තාක්

11 චතුමධුර පිළිබඳව ඉදිරියේ විස්තර වේ.

තබා පරිභෝග කළේ ද ඇවැතක් සිදු නොවේ. තම්බා පානය පමණක් නොව ඒවා හපා වැළඳීමට ද කැප ය. නෙල්ලි, සුදුළූණු[12] වැනි යාවජීවක බෙහෙත් තම්බා පානය කරන්නා සේ ම කෑලි වැළඳීමෙන් ද ඇවැත් නොවේ.

මෙසේ මේ කාලික පරිභෝගයේ දී දැනගත යුතු තවත් කරුණක් නම් මෙම කාලික මිශ්‍ර කිරීමෙන් ඒවායේ ඇති පරිභෝග කිරීමේ හැකියාව වෙනස් වන බව යි.

උදාහරණයක් ලෙස භික්ෂුවක් සතු පිළිගත් නෙල්ලි යාවජීවක ය. එයට සත්තාහකාලික වූ මීපැණි දමා සකස් කිරීමේ දී යාවජීවක වූ නෙල්ලිත් සත්තාහකාලික ගණයට පත් වේ. [13] එසේ ම සීනි වැනි සත්තාහකාලික දෙයක් ආහාරයක් සමග මිශ්‍ර වීමෙන් සත්තාහකාලිකයත් ආහාර ගණයට වැටේ. එසේ ම අනෙකුත් කාලිකයන් මිශ්‍ර වීම ගැන අවබෝධ කරගත යුතු ය.

මෙසේ කාලිකයන් ගැන දැන දැන ම භික්ෂූන් වහන්සේලාට නියම ආකාරයෙන් උපස්ථාන කිරීමෙන් පින්වත් ඔබ බොහෝ කුසල් රැස්කර ගන්නේ වෙයි.

## 1.3 සන්නිධිකාරකය

ආහාර ගත හැකි කාලයෙන් පිටත පිළිගෙන තබා ගන්නා සියලු ම ආහාර සන්නිධිකාරක නම් වේ. යාවකාලිකය ඉර අවරට යාමෙන් ද යාමකාලිකය පසු

12 ගිලන් නොවූ භික්ෂුවට සුදුළූණු අමුවෙන් වැළඳීම අකැප වේ.

13 මෙම කාරණය භික්ෂූන්ට අදාළවන කාරණයකි. දැන ගැනීම පිණිස මෙහි ඇතුලත් කළෙමි. සියල්ල ගිහිපින්වතුන් සකස් කිරීමේ දී මෙය අදාළ නොවේ.

දා අරුණ උදාවෙන් ද සන්නිධිකාරක වේ. සත්තාහකාලිකය අටවෙනි අරුණෙන් පසු සන්නිධිකාරකයක් නොවුන ද ඉවත්කළ යුතු ය. භික්ෂූන් වහන්සේලාගේ විනයට අනුව සන්නිධිකාරක තබා ගත නො හැක. එනම් කිරිපිටි, ටින්කෑම වැනි කල් තබා ගත හැකි ආහාර වර්ගයන් භික්ෂුව විසින් අත්හළ යුතු ය. පිළිගත යුත්තේ එදිනට සෑහෙන ප්‍රමාණය පමණි. ඉතිරි වුව හොත් අනුපසම්පන්නයන්ට අපේක්ෂාවක් නැති ව අත්හළ යුතු ය. අපේක්ෂාවකින් තොර ව එසේ අත්හළ දේ අනුපසම්පන්නයා විසින් ආරක්ෂා කොට නැවතත් පසුදින පිළිගැන්වූයේ නම් පිළිගැනීමෙන් හා වැළඳීමෙන් ඇවැත් නොවේ. එසේ කිරීම ප්‍රඥාවන්ත අනුපසම්පන්නයාගේ පිළිවෙත යි. එවැනි ආහාර භික්ෂූන් වහන්සේට පිළිනොගන්වා අනුපසම්පන්නයෙක් භාරයේ තැබීමෙන් භික්ෂුවට අවශ්‍ය වූ විටෙක පිළිගන්වාගෙන වැළඳිය හැක.

ලුණු වැනි යාවජීවක වශයෙන් ගත හැකි බෙහෙත් වුවද ආහාර සමග මිශ්‍ර වීමෙන් ඒවා ආහාර සංඛ්‍යාවට යනු ලැබේ. එම නිසා ආහාර සමග මිශ්‍ර කිරීමට තබා ඇති ලුණු නැවත බෙහෙත් හැටියට පාවිච්චියට ගත නො හැකි බව ද දැනගත යුතු ය. එමෙන් ම එම ලුණු තබාගෙන දිනපතා ආහාර සමග මිශ්‍ර කිරීමට ද අකැප ය. එක් දිනක් පරිභෝගයෙන් පසු ඉවත් කළ යුතු ය. එදින පිළිගත් ලුණු එදින පිළිගත් ආහාරත් සමග මිශ්‍ර කොට ඉතිරිය පසුවට ගැනීමට තබා ගත හැක. නමුත් එම ලුණු ආහාර සමග නැවත මිශ්‍ර කිරීම කළ නො හැක. ඒවා බෙහෙත් හැටියට පමණක් පරිභෝග කළ හැක. එසේ ම ඊයේ පිළිගත් ලුණු අද පිළිගත් ආහාර සමග මිශ්‍ර කළ නො හැක. ඒ ලුණු බෙහෙත් හැටියට පරිභෝග කර ඇති නිසා ය.

## 1.4 අෂ්ඨපාන ගිලන්පස

බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාරණ ලද පළතුරු වර්ග මිරිකා ජලය මිශ්‍රකොට පෙරා සකස් කරගන්නා ලද පාන වර්ග මෙම ගණයට ඇතුළත් වේ. ඒවා සකස් කිරීමේ දී සෑම පළතුරක් ම නොව කැප අකැප පළතුරු දැනගෙන කැප දේ පමණක් පිළියෙළ කළ යුතු ය. එම කැප පළතුරු නම් අඹපැන්, දඹපැන්[14], ඇටිකෙසෙල්පැන්, මස්කෙසෙල්පැන්, අමුම්දිපැන්, වියළිම්දිපැන්, උපුල් පැන්[15], මසන් (දෙබර) පානය යැයි පාන වර්ග අටකි. එම පාන වර්ග 8 හෝ ඒවාට අනුලොම් වන දොඩම්, නාරන්, බෙලි, දිවුල්, ඇපල් ආදී අනෙකුත් පළතුරු වර්ග ගිලන්පස සඳහා සකස්කොට පූජා කිරීම සුදුසු ය. ඒවා සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ද ඇත.

පළතුරු ගිලන්පස සෑදීමේ දී එය විශේෂයෙන් ම සිසිල් පැනින් සකස් කළ යුතු වන අතර එකට එකක් වත් සිසිල් ජලය දැමිය යුතු ය. උණුපැනින් සකස් කළ හොත් එය රත්වීම නිසා ආහාර පිසීමේ සංඛ්‍යාවට ඇතුළත් වන බැවින් ගිලන්පස හැටියට පස්වරුවේ වැළඳීමට නො හැකි ය. මෙසේ සිසිල් පැනින් සකස් කරගත් පානය කෑලි නොමැති වන සේ හොඳින් පෙරිය යුතු ය. (මේ සඳහා දැලක් භාවිතා නො කර පිරිසිදු කපු රෙදිකඩකින් තුන්වරක් පමණ පෙරා ගන්නා ලද පානය සුදුසු යැයි ආචාර්ය මතය යි. විනය දේශනාවේ සඳහන් වන හැටියට පළතුරු ගිලන්පස පෙරීම සඳහා භාවිතා කොට ඇත්තේ රෙදි කඩකි. මෙකල තාක්ෂණය යටතේ ඇති සිදුරු ඇති දැල රෙදි කඩට සමාන නොවේ. එම

14 දඹ (මාදං) ගෙඩි වලින් සාදා ගන්නා පැන්

15 රතු, නිල්, සුදු ආදී ඕලු වල කෙමිය මිරිකා සාදන ලද පැන්

නිසා ඇලකින් නොව රෙදි කඩකින් ම පෙරීම උචිත ය.) ඇසට පෙනෙන ප්‍රමාණයේ ඉතා කුඩා කැබැල්ලක් වුව ද වැළඳීමෙන් භික්ෂුවට ඇවැත් සිදු වේ. එම පානය ද ගින්නෙන් රත් කළ හොත් එය ද පරිභෝග කිරීමට නුසුදුසු ය. යම් භික්ෂුවකට සිසිල් ගිලන් පස ගැනීම අයෝග්‍ය වේ නම් එය හිරු එළියෙන් රත්කර ගත්තාට වරදක් නැත.

සමහරු බෙලි වැනි පළතුරු ගිලන්පස සෑදීමට ගැනීමට පෙර එය පහසු වීම සඳහා තම්බා ගනිති. එසේ තම්බාගත් බෙලි, ගිලන්පස සඳහා සුදුසු නොවේ. එයින් ගිලන්පස සෑදුව ද ඒවා ආහාර සංඛ්‍යාවට ම ඇතුළත් වේ. එම නිසා තම්බාගත් පළතුරු වලින් සාදන ගිලන්පස සවස් කාලයේ පූජා කිරීම නුසුදුසු ය. පළතුරුවලට අමතර ව උක්ගස් මිරිකා ගන්නා යුෂය ද ගිලන්පස සඳහා ගැනීම කැප ය. (ජලය මිශ්‍ර නොවූ උක්පැණි සත්තාහකාලික ගණයට ඇතුළත් වේ.)

## 1.5 ගිලන්පස සඳහා නුසුදුසු ගෙඩි වර්ග

විනය දේශනාවේ මහඵල නමින් කොටසක් ගිලන්පස සඳහා නුසුදුසු බව පෙන්වා දී ඇත.

තල්, පොල්, කොස්, දෙල්, ලබු, කොමඩු, පුහුල්, තියඹරා, කැකිරි යන නව මහාඵලයන්[16] සහ ඒවාට අනුලොම් වන වැල, වරකා, තැඹිලි, කුරුම්බා ආදිය ද ගිලන්පස සඳහා ගැනීම අකැප ය. මෙම පළතුරු සිසිල් දියෙන් සකසා පෙරා ගත්ත ද ආහාර සංඛ්‍යාවට ම ඇතුළත් වන බැවින් විකාලයෙහි ගිලන්පසක් ලෙස ගැනීමට නො හැක. ධාන්‍ය වලින් සාදා ගන්නා ලද

16 මහඵල යනු ගෙඩියේ විශාලත්වය අනුව කියන දෙයක් නොව බුදුරජාණන් වහන්සේ විසින් මහඵල යැයි සඳහන් කරන ලද දේවල් ය.

පානයන් ද විකාලයෙහි කැප නොවේ.

## 1.6 උණුවෙන් සාදා ගන්නා ලද ගිලන්පස

යමක් ඖෂධයක් හැටියට සම්මත නම් ඒවා වියළා තම්බා පානය සඳහා ගිලන්පස හැටියට සකසා ගත හැක. කාලිකවිභාගයේ යාවජීවක යනුවෙන් අදහස් වන සියලු ම දේ තම්බා පානයක් ලෙස ගත හැක. බෙලිමල්, රණවරා, කොත්තමල්ලි, වෙනිවැල්ගැට ආදී තවත් බොහෝ දේ මේ සඳහා ඇතුළත් වේ. බෙලි පළතුරක් ලෙස තම්බා සිසිල් ගිලන්පස සෑදීම අකැප වූ නමුත් බෙලිකටු වේලා තම්බාගත් පැන් බෙහෙතක් ලෙස ගැනීම කැප වේ. එලෙස සාදා ගත් පසු එය ගැනෙන්නේ පළතුරු ගිලන්පස හැටියට නොව බෙහෙත් හැටියට යි. එනමුත් බෙලි කටු තැම්බීමට ගැනීමේ දී සොඳින් සෝදා බෙලි මද ඉවත් කළ යුතු යි. යම් හෙයකින් බෙලි මද ඉතිරි වූ කටු තැම්බීමෙන් ගත් පානය විකාලයෙහි අකැප ය.

## 1.7 චතුමධුර

චතුමධුර යනු ඉහත කී සත්තාහකාලිකයට අයත් බෙහෙත් වර්ග සතරක් මිශ්‍ර කොට සාදා ගන්නකි. ගිතෙල් හෝ තලතෙල්, වෙඬරු (බටර් - මේ සඳහා මාගරින් ගැනීම යෝග්‍ය නොවේ. එය කිරිවලින් නොව වෙනත් ක්‍රම වලින් සකස් කරන්නා වූ ආහාරයක් වන බැවිනි.) හකුරු (උක් හෝ කිතුල් හෝ වෙනත්) සහ මී පැණි යන සතර වර්ගය එකට කලවම් කොට සාදා ගන්නකි. එය රත් කර සාදා ගත්ත ද වරදක් නැත. එය දින සතක් තබාගෙන පරිභෝග කළ හැකි ය. ඒවා කොපමණ සෑදුවත් ඒ සියල්ල භික්ෂුවගේ අතට පිළිනොගන්වා කැපකරුවෙකුට භාර දෙන්නේ නම්

භික්ෂූන්ට අවශ්‍ය වේලාවට පිළිගන්වා ගෙන පරිභෝග කළ හැකි ය. කැපකරුවෙක් නැති ස්ථානයක නම් ඒවා පූජා කිරීමේ දී අපතේ නො යන පමණට පිළියෙළ කොට පූජා කිරීම සුදුසු ය.

## 1.8 විකාලභෝජනය

උදෑසන අරුණෝදයේ පටන් දහවල් මධ්‍යාහ්නය දක්වා ඇති කාලය භික්ෂූන් වහන්සේලාට ආහාර ගැනීමට ඇති කාලය යි. එයින් පිටත ඇති කාලය විකාලය නම් වේ. එම නිසා අරුණත් මධ්‍යාහ්නයත් අවබෝධ කරගෙන භික්ෂූන් වහන්සේට දානය වැළඳීමට කාල වේලා ඇති වන පරිදි දානය දීමට වගබලාගත යුතු ය. දානය පූජා කිරීමට භික්ෂූන් වහන්සේලා නිවසට වැඩමවනවා නම් සුදුසු කල් බලා වේලාසනින් වැඩමවීමෙන් භික්ෂූන්ට විකාල භෝජනයට පත් නොවී දන් වළඳා අවසන් කළ හැකි ය.

බොහෝ දෙනෙකු සිතා සිටින්නේ ගිලන් කමක් ඇති විට විකාල භෝජනයෙන් ඇවැත් නොවන බව ය. නමුත් විනයේ කිසිම තැනක ගිලන් බවක් නිසා විකාල භෝජන සික්ෂාපදය ලිහිල් කිරීමක් කර නැත. ගිලන් භික්ෂුවකට වුව ද මධ්‍යහ්නයෙන් පසු ආහාර ගැනීමෙන් විකාල භෝජන සික්ෂාපදය බිඳේ. විකාල භෝජන සික්ෂාපදය සිල් සමාදන් වන උපාසක උපාසිකාවන්ට ද මෙසේ ම බව දත යුතු යි.

එසේ කාලය මගහැරීමෙන් භික්ෂූන් වහන්සේට දානය මගහැරී ගිය හොත් අනුපසම්පන්නයා විසින් ඉහත කී ඉතිරි කාලික තුනෙන් යමක් සකස් කර දීමට ප්‍රඥාවන්ත විය යුතු ය.

## 1.9 අරුණ සහ මධ්‍යාහ්නය

මෙය භික්ෂූන් වහන්සේලාගේ විනය දේශනාවේ ඉතා වැදගත් කාරණයකි. අරුණ සහ මධ්‍යාහ්නය හොඳින් අවබෝධ කරගෙන සිටින්නේ නම් බොහෝ සිකපදවලින් ආරක්ෂා විය හැක.

අරුණ යනු සූර්යයා උදාවට පැය භාගයකට පමණ පෙර නැගී එන රැස් විශේෂයකි. එය නැගෙනහිර අහසේ තද රතු පැහැයෙන් දිස් වේ. එය මාලුවාගේ ඇස් වල පාට මෙන් තද රතුපාට යැයි විනයේ සඳහන් වේ. මෙම රත් පැහැය ඇති වන අවස්ථාව වන විට කුරුල්ලන් කෑ ගැසීම ආරම්භ කරයි. හාත්පස අන්ධකාරය කෙමෙන් කෙමෙන් අඩු වී යයි. වෙනත් ආලෝකයක් නොමැතිව පත්‍රවල නාරටි ආදිය දැකිය හැකි ය. මෙම අරුණෙන් පැය භාගයකට පමණ පසුව ඉර උදාවීම ආරම්භ වේ. මෙම අරුණ උදාව දිනෙන් දිනට වෙනස් වන නිසා දිනපතා මේ ගැන සැලකිලිමත් විය යුතු ය.

යම් ප්‍රදේශයක උදෑසන වැසි බර ගතියක් ඇත්නම් හෝ කැලෑ බහුල ව ඇත්නම් මෙම අරුණ වටහා ගැනීම තරමක් අපහසු ය. විනය සැක දුරු කර ගැනීම සඳහා ආලෝකය වැටෙන තෙක් සිටීම සුදුසු යැයි හැඟේ. බුද්ධ පූජාව හෝ භික්ෂූන් වහන්සේලාට ආහාර පිළිගැන්වීමට හා වැළඳීමට සුදුසු කාලය වන්නේ මෙම අරුණෙන් පසු කාලය යි. එනම් එළිය වැටී ඇති කාලය යි. අරුණ උදාවට පෙර අඳුරු කාලයේදී ද දානය වැළඳීමෙන් භික්ෂූන්ට විකාල භෝජනය සිදු වේ. එමෙන් ම අරුණට පෙර ආහාර පිළිගැනීමෙන් සියලු ම භික්ෂූන් වහන්සේලාට එම ආහාරය අකැප වේ. ඉදිරියේ එන සයනය කිරීම ආදී තැන්වල ගැනෙන්නේ

ද මේ කී අරුණ ම ය. ඒ නිසා ගිහි පින්වතුන් විසින් අරුණ ගැන මනා අවබෝධයක් ඇති කරගත යුතු ය.

මධ්‍යාහ්නය නම් ඉර මුදුන් වන වේලාව යි. දවල් 12ට ම ඉර මුදුන් වේ යැයි සමහරුන්ගේ මතය යි. නමුත් දිනපතා මධ්‍යාහ්නය දහවල් 12ට ම සිදු වන්නේ නැත. දිනෙක 12ට කලිනුත් තවත් දිනෙක 12න් පසුවත් මෙම මධ්‍යාහ්නය සිදු වේ. එම නිසා දානය පූජා කිරීමේ දී දායකයා විසින් මෙම මධ්‍යාහ්නය අවබෝධ කරගෙන මධ්‍යාහ්නයට පළමු ව දානය වළඳා අවසන් කළ හැකි වන සේ කල් ඇති ව දානය සකසා පූජා කිරීමෙන් භික්ෂුවට වන ආපත්තිවලින් වැළකීමට උපකාරයක් වේ.

## 1.10 ආහාර පවාරණය

භික්ෂුවක් දන් (පඤ්චභෝජනයක්) වළඳමින් සිටින අවස්ථාවක දී තවත් කෙනෙක් දානය (පඤ්ච-භෝජනයක්) පූජා කිරීමට පැමිණි විට එය ප්‍රතික්ෂේප කිරීම ආහාර පවාරණය නම් වේ. එසේ පවාරණය වූ පසු එම ආසනයෙන් ඉවත් වී නැවත ආහාර වැළඳුව හොත් ඇවතක් සිද්ධ වේ. මෙම ආපත්තිය හුදෙක් ගිහියන්ගේ නො දැනුවත්කම නිසා භික්ෂූන්ට සිදු වන්නකි.

මෙම පවාරණය සිදු වීමට අංග පහක් සම්පූර්ණ විය යුතු ය.

1. භික්ෂුව විසින් පඤ්චභෝජනයන් අතුරෙන් එකක් හෝ දෙකක් හෝ සියල්ලෙන් දන් වැළඳීමට ආරම්භ කර තිබිය යුතු ය. පඤ්චභෝජන නම් ඕදන, කුම්මාස, සත්තු, මච්ඡ, මංස යි. ඕදන යනු බත් ය. හැල් හා සෙසු වී වර්ග, යව, තිරිඟු, තණ සහල්, වරා නම් ධාන්‍ය, අමු යන ධාන්‍ය එසේ ම ඒවායින් සකස්

කරන ලද බත් මෙන් ආහාරයට ගන්නා වෙනත් ආහාර වර්ග ද මෙම ඕදන සංඛ්‍යාවට යයි. (සහල් ආදිය කොටා පිටි ගෙන සාදන ආප්ප, ඉඳිආප්ප වැනි ආහාර ඕදන සංඛ්‍යාවට අතුළත් නොවේ.) එසේ ම ඒවායින් සාදන ලද දියරමය කැඳක් වුව ද හැන්දකින් ගත් තැනෙහි අඩු ව පෙනේ නම් එය ද ඕදන සංඛ්‍යාවට ම ඇතුළත් වේ. කුම්මාස යනු යව සහලෙන් හෝ ඉරිඟු වලින් සාදන ලද කෑමකි. සත්තු යනු බැදපු ඇට වර්ග කුඩුකර එම පිටි වලින් සාදන අග්ගලා වැනි ආහාරයකි. පුබ්බණ්ණ ධාන්‍ය වන ඉහත කී ඕදන සංඛ්‍යාවට යන ධාන්‍යවලින් පමණක් සෑදු පිටි මෙහි සත්තු සංඛ්‍යාවට යයි. අපරණ්ණ ධාන්‍ය වන මුං, මෑ, තල, කොල්ලු, ලබු, කොමඩු ආදිය මෙහි ඇතුළත් නොවේ. මච්ඡ යනු දියමස් ය. මංස යනු ගොඩ මස් ය. දියමස් ගොඩමස් යොදා සකස් කළ වෙනත් ආහාර ආදිය ද පඤ්ච භෝජනයට ම ඇතුළත් වේ. මෙම අංගය සම්පූර්ණ වීමට ඉහත කියන ලද පඤ්ච භෝජනයෙන් හෝ ඒවායින් සකස් කරන ලද ආහාරයකින් එක් පිඩක් හෝ වළඳා තිබීම ප්‍රමාණවත් ය.

2. තවත් වැළඳීමට අතේ හෝ මුඛයේ හෝ පාත්‍රයේ ඉහත කී පඤ්ච භෝජනයන්ගෙන් යමක් ඉතිරි වී තිබීම දෙවන අංගය යි. එනම් ආහාර වළඳා අවසන් නොවී තිබීම යනු යි. සුළු කොටසක් හෝ ඉතිරි වීම මෙම අංගය සම්පූර්ණ වීමට ප්‍රමාණවත් වේ.

3. ඉහත කී පඤ්ච භෝජනය හෝ එයට අනුලොම් වන ආහාරයක් දායකයා විසින් ගෙනවිත් බෙදන්නට නැඹුරු වීම.

4. ඔහු භික්ෂුවගේ අත්පස[17] සිටීම.
5. භික්ෂුව විසින් කයින් හෝ වචනයෙන් එම ආහාරය ප්‍රතික්ෂේප කිරීම.

යන අංග පහ සම්පූර්ණ වීමෙන් භික්ෂුවට ආහාර පවාරණය සිද්ධ වේ. එසේ ආහාර පවාරණය වූ පසු එම භික්ෂුවට වැළඳූ ආසනයෙන් නැගිට වෙනත් ආසනයක සිට නැවතත් දානය වැළඳීමට අවකාශයක් නැත. එසේ වැළඳුව හොත් ඇවැත් සිද්ධ වේ. උදාහරණයක් ලෙස උදේ දානය වළඳන අවස්ථාවේ දී ආහාර පවාරණයක් සිදු වී එම වළඳමින් සිටි ආසනය වෙනස් කළ හොත් එම භික්ෂුවට දවල් දානය වැළඳීමට නම් තවත් භික්ෂුවක් සමග විනයපිටකයේ දැක්වෙන අවශ්‍යතාවයන් කිහිපයක් සම්පූර්ණ කළ යුතු වේ.

මෙම ආහාර පවාරණය බොහෝ විට නිවෙස්වල දානවලට යාමේ දී සිදු වේ. එම නිසා දානය සකස් කරන පිළිගන්වන දායකයා විසින් මේ ගැන සැලිකිලිමත් විය යුතු ය. දායකයා අඩු පාඩු බත් ආදිය බෙදීමට යන විට අත්පසට නො යා මදක් ඈත් වී ඇසීමෙන් හෝ බෙදන්නට නො යා පෙනෙන ලෙස යෑමෙන් හෝ ආහාර ගේන්නේ නැතිව අසාගෙන ගොස් පසුව ගෙනත් බෙදීමෙන් හෝ පඤ්ච භෝජනයන් හැර අනෙක් ආහාර ගෙනත් බෙදීමෙන් ද එම භික්ෂුවට පවාරණයෙන් ආරක්ෂා විය හැක. තව ද දායකයා දුරින් එන විට ම භික්ෂුව විසින් පාත්‍රය අතින් වසා ගෙන ඇත්නම් එයින් ම භික්ෂුවගේ අදහස ඔහු විසින් අවබෝධ කරගෙන බෙදන්නට නො යා යුතු ය.

17 ඉහත පිළිගැනීම යන මාතෘකාව යටතේ අත්පස විස්තර වේ.

## 1.11 ආහාර කප්පියං (කැප) කිරීම

විනයේ එන සික්ෂාපදයක් යටතේ භික්ෂූන්ට පැලවෙන ඇට වර්ග, අතු, ඉති, මුල් සහිත ආහාර වැළඳීම තහනම් කර ඇත. ඒවා වළඳන්නේ නම් අනුපසම්පන්නයන් විසින් විනයානුකූල ව කැප කර දිය යුතු ය. එය 'කප්පියං කිරීම' නම් වේ. විශේෂයෙන් ම පළතුරු ආදිය හා මිරිස් ඇට අමුවෙන් යෙදූ සම්බෝල, ලුණුමිරිස් ආදිය පිළිගැන්වීමේ දී මේ පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

මෙම 'කප්පියං කිරීම'[18] ක්‍රම කිහිපයකට කළ හැක. ගින්නෙන් පිළිස්සීම, ආයුධයෙන් කැපීම හෝ විදීම, නියපොත්තෙන් කැඩීම, ඇට නැති පළතුරු ගැනීම (ඇට ඉවත් කර පූජා කිරීම), හා පැල නොවන ඇට ඇති පළතුරු පිළිගැන්වීම යනුවෙන් පස් ආකාරයකි.

භික්ෂූන් වහන්සේ විසින් "කප්පියං කරෝහි"[19] කීමෙන් පසු ව එම ඵලය හෝ ලුණුමිරිස් ආදී ව්‍යංජනය පිහියකින් "කප්පියං භන්තේ"[20] යනුවෙන් පවසමින් තුන් සැරයක් කැපීම හෝ එම ආයුධයෙන් විදීමක් හෝ කළ යුතු ය. එසේ කප්පියං කිරීමේ දී පිහිය හෝ ආයුධය එම ඵලයේ හෝ ව්‍යංජනයේ ගැවී කැපීමක් හෝ පළුදු වීමක් සිදු විය යුතු ය. එසේ නො කළ හොත් කප්පියං කිරීම අසාර්ථක ය. එම ඵලය වැළඳීමට නො හැක. එසේත් නැත්නම් භික්ෂුව "කප්පියං කරෝහි" කී පසු "කප්පියං භන්තේ" කියා නියපොත්තෙන් වුව ද කැඩිය හැකි ය. (මෙය විනයේ සඳහන් වුව ද නියපොතු වල පිරිසිදු බව

18 කැප කිරීම

19 "කැප කරන්න" යනු එහි අදහස යි.

20 "කැපයි ස්වාමීනි" යනු එහි අදහස යි.

පිළිබඳ ව සැලකිය යුතු ය.) එසේත් නැත්නම් ගින්නෙන් පිළිස්සීම ද කළ හැකි ය.

යම් ව්‍යංජනයක් දියර සහිත නම් එය හැන්දකින් ගත් පසු හැන්දෙන් ගත් තැන නො පෙනේ නම් එය කප්පියං කිරීම පෙර මෙන් කළ නො හැකි ය. යම් දියරමය ව්‍යංජනයක හෝ පානයක පැළවෙන ඇට බහා සකස් කර ඇත්නම් එවැනි දේ පිහියකින් කපා කප්පියං කිරීම කළ නො හැකිය. ඒ මන්ද යත් පිහියෙන් ජලය ආදීය කැපීමක් කළ නො හැකි බැවිනි. එවැනි දේ කප්පියං කිරීමට නම් අනුපසම්පන්නයකු විසින් එය මදක් රත් කර දීමෙන් එය කැප වේ. (එවැනි දෙයක් කප්පියං කිරීමේ දී භික්ෂුව "කප්පියං කරෝහි" කී කල්හි පිහියක් හෝ යම් ආයුධයක් රත් කර "කප්පියං භන්තේ" කියා එය එම ව්‍යංජනයේ හෝ පානයේ ගිල්වීම වර්තමාන ආචාර්යවරුන් කරන තවත් ක්‍රමයකි.)

එසේ කප්පියං කර ඵල වර්ග අනුභව කළ හැකිය. එසේත් නැත්නම් අනුපසම්පන්නයන් විසින් එම පළතුරු වල ඇට ඉවත් කර දීමෙන් ද කප්පියං නො කර ම වැළඳිය හැක. උදාහරණයක් ලෙස මිදි ආදිය දෙකට කපා ඇට ඉවත්කර ඇත්නම් එය නැවතත් කප්පියං කිරීමක් අවශ්‍ය නොවේ.

පලතුරු වට්ටියක් පමණ කප්පියං කිරීමේ දී ඒ පලතුරු සියල්ල එකින් එක ගැටී ඇත්නම් එක් පලතුරක් කැපීමෙන් සියලු ම පලතුරු කප්පියං කිරීම සිද්ධ වේ. එකක් හෝ ගැවී නො තිබුණ හොත් එම පලතුර නැවත කප්පියං කිරීම සිදු කළ යුතු ය. මෙය අනුභව කරන දේ සඳහා පමණක් නොව පැළවෙන ඇට, අතු, මුල් ආදී සියලු දේ සඳහා වලංගු වේ. කසාය තැම්බීමේ දී එහි ඇති කොත්තමල්ලි ආදිය පැලවෙන නිසා භික්ෂුවකට

එය ලිපේ තබා තැම්බීම කළ නො හැක. එවැනි අවස්ථාවක අනුපසම්පන්නයා විසින් කැප කර දිය යුතු ය. එය ද පෙර කී සෙයින් ම කප්පියං කළ හැක. තව ද කපා දමා ඇති අමු උණගසක් වැනි පැළ වෙන අත්තක් කපා ගැනීමට උවමනා නම් එය ද අනුපසම්පන්නයා ලවා කැප කරවා ගෙන භික්ෂුව විසින් ම කපා ගත හැක. උණ ගස දිග බැවින් කප්පියං කිරීමේ දී කෙළවරක් පමණක් ඔසවා කප්පියං කිරීම ප්‍රමාණවත් වේ. මෙසේ කප්පියං කළ හැක්කේ පොළොවෙන් හෝ ගසෙන් වෙන් වී ඇති දේවල් පමණි. ගසේ ඇති ගෙඩියක් ගසෙන් වෙන් නො කොට කප්පියං කළ නො හැක. මේ සම්බන්ධ ව තවත් විස්තර ඉදිරියේ ගස් කැපීම යන මාතෘකාව යටතේ විස්තර වේ.

මෙම කප්පියං කිරීම යනු එම ඵලයේ ඇති බීජයේ වැඩෙන බව නැති කිරීමක් නොව විනය කර්මයක් කොට කැප කර දීමක් පමණක් බව සැලකිය යුතු යි.

## 1.12 කැප අකැප මත්ස්‍ය මාංශ

බුදුරජාණන් වහන්සේ විසින් ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශය භික්ෂූන්ට අනුදැන වදාරා ඇත. එනම් තුන් ආකාරයකින් පිරිසිදු වූ මාංශය යි. යම් මාංශයක් පූජා කිරීමේ දී එය භික්ෂුව විසින් භික්ෂූන් උදෙසා මරණු නො දුටු, භික්ෂූන් උදෙසා මරණ ලදැයි නො ඇසූ, භික්ෂූන් උදෙසා මරණ ලදැයි සැකයක් හෝ ඇති නොවූ මාංශය ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශය වේ. එය වැළඳීමෙන් භික්ෂුවට ඇවැත් නොවේ.

එසේ ත්‍රිකෝටි පාරිශුද්ධ ආකාරයෙන් ලැබුව ද වැළඳීමට අකැප මාංශ දහයක් බුදුරජාණන් වහන්සේ විසින් පණවා ඇත. ඒවා නම් මිනීමස්, අලිමස්,

අශ්වමස්, බලුමස්, සර්පමස්, සිංහමස්, ව්‍යාඝ්‍රමස්, දිවිමස්, වලස්මස් සහ කරබානාවලස්මස් (වලස් වර්ගයකි) යන ඒවා ය. ඒවා ලැබුණ ද නො වැළඳිය යුතු ය. එම නිසා මත්ස්‍ය මාංස පිළිගැන්වීමේ දී මේ කරුණු සලකා බලා තමන්ටත් භික්ෂුවටත් අකුසලයක් නොවෙන ආකාරයෙන් කටයුතු කිරීමට වගබලා ගත යුතු ය.

### 1.13 ආහාර පිසීම

භික්ෂුවක් තමා විසින් ම පිස අනුභව කිරීම කැප නොවේ. පිසූ දෙයක් නැවතත් රත් කිරීමෙන් ඇවැතක් නැත. මෙකල ඇති ක්ෂණික නූඩ්ල්ස් ආදිය එක් වරක් පිස අසුරා ඇති බැවින් එය (රසකාරක ඇසුරුමෙහි නොපිසන ලද ලුණු ආදිය ඇති බැවින් එය හැර) භික්ෂූන් වහන්සේලාට නැවත පිස අනුභව කිරීමෙන් ආපත්ති නොවේ. සම්බෝලයක් වැනි දෙයක් අමුවෙන් ම කලවම් කර අනුභව කිරීමට ද පුළුවන. (එවැනි අවස්ථාවල දී කප්පියං කිරීම ආදී කැප කිරීමක් කිරීම ප්‍රමාණවත් ය.) යමක් ලිපේ තබා ගින්නෙන් රත් කිරීම මෙහි පිසීම යනුවෙන් අදහස් කරයි. එම නිසා අමු ආහාර පූජා කිරීමේ දී පිසීමට කෙනෙක් සිටිනවා ද නැද්ද යන වග දායකයා විසින් විමසීම වැදගත් ය.

## 2. මුදල් සම්බන්ධයෙන් දත යුතු කරුණු

බුදුරජාණන් වහන්සේගේ විනය දේශනාවේ භික්ෂූන් වහන්සේලාට මුදල් පරිහරණය මුළුමනින් ම තහනම් කර ඇත. යම් කෙනෙක් රන්, රිදී, මසු, කහවණු, මුදල් ආදියක් “මෙය ඔබ වහන්සේට පුදමි”යි ඉදිරියේ තැබූ දෙය අතටවත් නො ගෙන “මෙය මගේ”යි ඉවසා නම් භික්ෂුවට ඇවැත් වේ. භික්ෂුවගේ ධනය මුදල් නොවන නිසා අන් අය උදෙසාවත් පිළිගැනීම නුසුදුසු ය.

## 2.1 මුදල් පූජා කිරීමේ දී කළයුතු දේ

ගිහි පින්වතෙක් මුදලක් භික්ෂුවකට පරිත්‍යාග කළ හොත් එය ප්‍රතික්ෂේප කිරීම හැර වෙන කිසි ම දෙයක් නො කළ යුතු ය. මෙහි දී භික්ෂුව හා ගිහි පින්වතුන් යන දෙපිරිස විසින් ම ඉතාමත් නුවණින් යුතු ව ක්‍රියා කළ යුතු ය. මේ පිළිබඳ සික්ෂාපද කිහිපයක් භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ දැක්වේ. ඒ සෑම සික්ෂාපදයකින් ම නීතිය දැඩි කිරීම පමණක් කර ඇතිමුත් කිසිම තැනක ලිහිල් කිරීමක් කර නැත. ගිහි පින්වතුන්ගේ විනය නො දැනීම නිසා භික්ෂුවට බොහෝ ඇවැත් විය හැක. භික්ෂුවක් කෙරෙහි මුදල් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය විශේෂයෙන් ගිහි පින්වතුන් දැනුවත් ව සිටිය යුතු යි.

යමෙකු විසින් භික්ෂුවකට මුදල් පරිත්‍යාග කළ හොත් භික්ෂුව විසින් එය ප්‍රතික්ෂේප කළ යුතු යි. එසේ ප්‍රතික්ෂේප කළ පසු ප්‍රඥාවන්ත ගිහි පින්වතුන් විසින් එම භික්ෂුවගෙන් කරුණු විමසා කැපසරුප්[21] ආකාරයෙන් ඒ වියදමින් භික්ෂුවගේ සිවුපස පරිහරණයට පහසු වන සේ කටයුතු කළ යුතු යි. භික්ෂුව විසින් මුදල් ප්‍රතික්ෂේප කිරීම පමණක් කළ හැකි අතර කිසිම කෙනෙකුට එම මුදල දෙන ලෙස කිව නො හැක. භික්ෂුව විසින් ප්‍රතික්ෂේප කළ කල්හි ඒ පූජා කළ තැනැත්තා විසින් ස්වාමින්වහන්සේට කැපකරුවෙක්[22] ඇත්දැයි විමසා සිටිය යුතු ය. එසේ විමසීමේ දීත් භික්ෂුවට කැපකරුවෙක් ඇත්නම් ඇතැයි කිවහැකිමුත් ඒ කැපකරුවාට දෙන්න යැයි කිව නො හැක. එසේ

---

21 විනය විරෝධී නොවන ආකාරයෙන්

22 භික්ෂුවට හිතකාමී විශ්වාසවන්ත පුද්ගලයෙක් (නො නෑ පවරණ ලද පුද්ගලයෙක්)

කැපකරුවා දැනගත් ගිහි පින්වතා විසින් කැපකරුවා හමු වී භික්ෂූන් වහන්සේ වෙනුවෙන් වියදමක් දුන් පසු එම කැපකරුවා විසින් කැපසරුප් ආකාරයෙන් භික්ෂුව වෙත පැවරීමක් කළ යුතු යි. ඒ මෙසේ යි. “ගරු ස්වාමින් වහන්ස, ස්වාමින් වහන්සේගේ සිවුපසය වෙනුවෙන් මෙතුමා විසින් මා වෙත මෙපමණ ප්‍රමාණයක වියදමක්[23] දී ඇත. ස්වාමින් වහන්සේට අවශ්‍ය සිවුපසයක් වෙත්නම් මා වෙත දන්වනු මැනවි” කියා ය. එසේ පැවරීමෙන් පසු ව භික්ෂුව විසින් අවශ්‍ය දේ එම කැපකරුවා ලවා ගෙන්වා ගත හැක. එය එහි නිවැරදි පිරිසිදු පිළිවෙත යි.

යම් හෙයකින් කැපකරුවෙකු නොමැති නම් එම මුදලින් භික්ෂුවට ප්‍රයෝජනයක් නැත. එය එම දායකයන් විසින් ම රැගෙන යා යුතු ය. එසේත් නැත්නම් භික්ෂුවගේ අණ කිරීමක් නැති ව ගිහි පින්වතුන් විසින් ආරක්ෂිත තැනක තබා යා හැක.

## 2.2 කැපකරුවෙක් හරහා අවශ්‍ය දේ මිල දී ගැනීම

භික්ෂුවක් විසින් කැපකරුවෙක් සමග වෙළඳසැලකට ගොස් බඩු ගැනීමේ දී භික්ෂුව විසින් කිව යුත්තේ මට මේ දෙය අවශ්‍ය බව පමණකි. මේ බඩුව සඳහා මුදල් දෙන්න කියා කිව නො හැක. ප්‍රඥාවන්ත කැපකරුවා විසින් භික්ෂුව කී දේ තේරුම් ගෙන ඒ අවශ්‍ය දේ අරගෙන දීමට දැනගත යුතු ය. භික්ෂුවකට මුදලක් තවත් කෙනෙකුට දීමට උවමනාව ඇත්නම් ඒ බව “අර පුද්ගලයාට මෙපමණ මුදලක් දෙන්න” කියා කෙලින් ම කිව නො හැක. කිව හැක්කේ “අර පුද්ගලයාට මෙපමණ මුදලක අවශ්‍යතාවයක් ඇත,

23 මුදල් ප්‍රමාණයක්

මෙපමණ වියදමක් පියවීමට ඇත" යනාදී වශයෙන් වක්‍රාකාර ව ය. එවැනි අවස්ථාවල දී එහි අදහස තේරුම් ගැනීම ප්‍රඥාවන්ත ගිහි පින්වතුන්ගේ ක්‍රමය යි.

## 2.3 පොදු පරිහරණය සඳහා මුදල් පූජා කිරීම

ගිහි පින්වතුන් විසින් මුදලක් ගෙන "මෙය චෛත්‍යයේ හෝ විහාරයේ හෝ නවකර්මාන්තයකට දෙමි" කියා නම් එය භික්ෂුවට ප්‍රතික්ෂේප කළ නො හැක. එවැනි අවස්ථාවල දී "මොහු මෙසේ කියන්නේ ය" කියා සුදුසු කෙනෙකුට හෝ කැපකරුවෙකුට දැන් විය යුතු ය. භික්ෂුවට කිසිසේත් ම මුදල් පිළිගත නො හැක.

## 2.4 අමතක වූ මුදලකට කළ යුතු දේ

යම් ගිහි පින්වතෙක් මුදල් පසුම්බියක් භික්ෂුව වෙසෙන ආරාමයේ අමතක වී ගිය හොත් හෝ වැටී ගිය හොත් එය භික්ෂුව විසින් ගෙන හෝ අන් කෙනෙකු ලවා ගෙන්වා "අයිතිකරුවන් පැමිණ ගෙන යත්වා" යන අදහසින් තැන්පත් කර තැබිය හැක. නමුත් යම් මුදලක් හෝ රත්රන් ආදියක් ගිහියන් විසින් අරක්ෂාව සඳහා භික්ෂුවක් සන්තකයේ හෝ භික්ෂූන් වහන්සේලා වසන කුටියක තැබීම සුදුසු නැත.

මේ ආකාරයෙන් අකැප වස්තූන් භාර ගැනීමෙන් හා පරිභෝග කිරීම භික්ෂූන්ට ආපත්තිකර ය.[24]

## 2.5 අකැප භාණ්ඩ හුවමාරුව

අකැප භාණ්ඩ හුවමාරුව කැප නොවේ. අකැප වූ මුදලක් දී කැප වූ පාත්‍රයක් ගැනීම මෙයට එක් උදාහරණයකි. මෙසේ අකැප වූ මුදල නිසා එයින් ගත්

24 ඇවැත් වේ.

පාත්‍රය ද භික්ෂූන්ට අකැප වේ. මේ ආකාරයෙන් අන්‍ය වූ අකැප හුවමාරු ගැන ද දැනගත යුතු ය. මේ සඳහා උදාහරණයක් ලෙස පාත්‍රා සතරක් ගැන විනයේ සඳහන් වේ.

1. භික්ෂුවක් මුදල් පිළිගෙන ඒ මුදලින් යකඩ ගෙන ඒවායින් පාත්‍රයක් සාදවන ලද්දේ නම් එය මහා අකප්පිය පාත්‍රයක් වේ. එය කිසි ම ආකාරයකින් නැවත කැප කළ නො හැක. එම පාත්‍රය උණුකොට එයින් තැටියක් කළ ද එය අකැප තැටියකි. පිහියක් කළ ද එය අකැප පිහියකි. එසේ සාදාගත් පිහියෙන් කපාගත් දෙය ද අකැප ය.
2. භික්ෂුවක් මුදල් පිළිගෙන ඒ මුදලින් පාත්‍රයක් ගත හොත් ඒ පාත්‍රය ද භික්ෂු භික්ෂුණී සාමණේර සාමණේරී සික්ඛමානා[25] යන සැමට ම අකැප ය. ඒ පාත්‍රයට දුන් මුදල, මුදල් හිමියාටත් පාත්‍රය, පාත්‍ර හිමියාටත් දුන හොත් ඉන්පසු භික්ෂුවක් කප්පිය භාණ්ඩයක් දී ඒ පාත්‍රය ගත හොත් කැප ය.
3. භික්ෂුවක් මුදල් පිළිගෙන කප්පියකාරකයකු හා කම්හලකට ගොස් මේ පාත්‍රය මට හොඳය යි කී කල්හි කැපකරුවා මුදල දී පාත්‍රය ලබා දුන හොත් එය කප්පිය ව්‍යවහාරයෙන් ලද දෙයක් වුව ද කලින් පිළිගත් මුදලට ලද වස්තුවක් වන බැවින් අකප්පිය වේ. භික්ෂුව පිළිගත් මුදල නිස්සජ්ජනය[26] කිරීමෙන් පසු කැප කරුවකු එයින් පාත්‍රයක් ගෙන ආයේ නම් එය මුදල් පිළිගත් භික්ෂුවට හැර සෙස්සන්ට කැප ය.

25 සික්ඛමානා නම් උපසම්පදාව සඳහා අවුරුදු දෙකක් දස සික්ෂාපදයන්හි පුහුණුව ලබන සාමණේරිය යි.

26 විනය කර්මයක්

4. මේ මුදලින් පාත්‍රයක් මේ භික්ෂුවට ගෙන දෙන්න යයි කියා දායකයකු විසින් යවන ලද කප්පිය කාරකයා හා භික්ෂුව වෙළෙඳසැලට ගොස් පාත්‍රයක් දැක මේ මුදල් ගෙන මේ පාත්‍රය දෙන්න ය කියා පාත්‍රයක් ගත හොත් ඒ පාත්‍රය ඒ භික්ෂුවට අකැප ය. අකැපවන්නේ මුදල් පිළිබඳ කථාවක් කළ බැවිනි. පිළිගත් මුදලකින් නො ගන්නා ලද්දක් නිසා එය අන්‍ය භික්ෂූන්ට කැප ය.

මේ අකප්පිය පාත්‍ර සතර ය. මේ ආකාරයෙන් මුදල් සම්බන්ධ ව අවබෝධ කරගත යුතු ය.

දායකයකු විසින් මේ තෙරුන් වහන්සේට පාත්‍රයක් ගෙන දෙන්න ය යි මුදල් දී යවන ලද කැපකරුවා හා භික්ෂුව වෙළඳසැලට ගොස් තමාට කැමති පාත්‍රය දැක්වූ කල්හි කැපකරුවා මුදල දී ඒ පාත්‍රය ගෙන දුන්නේ නම් එය සැමට ම කැප පාත්‍රයක් වේ.

## 2.6 කැප භාණ්ඩ හුවමාරුව

තව ද කැප භාණ්ඩ හුවමාරුව ද භික්ෂූන්ට අකැප වේ. උදාහරණයක් ලෙස කැප වූ පිරිකරක් දී ලබාගත් කැප පිරිකර පරිභෝගයෙන් ඇවැත් සිදු වේ. මෙහි දී කැප පිරිකර භික්ෂු, භික්ෂුනී, සික්ඛමානා, සාමණේර, සාමණේරී යන පස් දෙනා සමග හුවමාරුවෙන් ඇවැත් නොවේ. ඇවැත් සිදු වන්නේ මේ හුවමාරුව ගිහියන් සමග සිදු වුව හොත් පමණි. උදාහරණයක් ලෙස "මේ සිවුර ගෙන මට කුඩයක් දෙන්න" යනාදී ක්‍රමයෙන් කැප භාණ්ඩයකට තවත් කැප භාණ්ඩයක් ඉල්ලීම මෙහි අදහස් කරයි. මේ ආකාරයෙන් කැප භාණ්ඩයකට තවත් කැප භාණ්ඩයක් හුවමාරු කිරීම භික්ෂූන්ට කැප නොවේ. භික්ෂූන්හට අකැප නො වන ආකාරයෙන්

මෙය කිරීමට විනය දත් නුවණැති භික්ෂූහු දනිති. ඒ මෙසේ යි.

යම් භික්ෂුවක් ළඟ සිවුරු පමණට වඩා වැඩිපුර ඇත්නම් හා කුඩයක් නොමැති නම් එම භික්ෂුව කුඩ ඇති ගිහි කෙනෙක් ළඟට ගොස් කෙලින් ම ඉල්ලීම නො කර මෙසේ කියයි. “මගේ ළඟ සිවුරු පමණට වඩා ඇත. ඒවායින් ප්‍රයෝජනයක් නැත. නමුත් මට කුඩයක් නොමැත. මට කුඩයකින් ප්‍රයෝජනයක් ඇත” යනුවෙනි. එසේ කී විට ඒ ප්‍රඥාවන්ත ගිහි පුද්ගලයා භික්ෂුවගේ අදහස දැන සිවුරක් ගෙන කුඩයක් දුන්නේ නම් ඒ භික්ෂුවට ඒ කුඩය කැප ය. එයින් භික්ෂුවට ඇවතක් ද සිදු නොවේ. මේ ක්‍රමයෙන් කැප භාණ්ඩ පමණක් හුවමාරු කළ හැක. කිසි ම ආකාරයකින් අකැප භාණ්ඩ හුවමාරු කළ නො හැක. මෙය ගිහිපින්වතුන් දැන ගන්නේ නම් ප්‍රයෝජනවත් වේ යැයි සිතූ බැවින් මෙහි ඇතුළත් කළෙමි.

## 2.7 රන් රිදී මුතු මැණික්

මිල මුදල්වලට අමතර ව රන්, රිදී, මුතු, මැණික්, දියමන්ති ආදිය ද භික්ෂූන්ට අකැප ය. ඒවා භික්ෂූන් වෙත පිළිගැන්වීම ද යෝග්‍ය නොවේ. සේනාසනයේ යම් යම් කටයුතු සඳහා ඒවා පිළිගැන්වීමේ දී ස්ථාන භාර ස්වාමින් වහන්සේට ඒ බව මතක් කර ඒ කටයුතු භාර ගිහි පින්වතුන්ට දීම එහි ක්‍රමය යි.

## 2.8 අනාමර්ශ වස්තු

අනාමර්ශ නම් ස්පර්ශ නො කළ යුතු යන අදහස යි. මෙසේ භික්ෂූන් වහන්සේලාට අතින් හෝ අන් ශරීරාංගයකින් ස්පර්ශ කිරීමට නො හැකි දේ මෙහි ඇතුළත් වේ. ස්ත්‍රී ශරීරය පළමු අනාමර්ශ වස්තුව වේ.

මෙහි දී මනුශ්‍ය ස්ත්‍රිය පමණක් නොව තිරිසන් ස්ත්‍රිය ද ස්පර්ෂ කළ නො හැක. මව මාතෘ ප්‍රේමයෙන් වුව ද ස්පර්ෂ කිරීමෙන් ඇවැත් වේ.

එසේ ම ස්ත්‍රීන් සතු වස්ත්‍රාභරණයන් ද අනාමර්ශ වස්තූන් ය. සමහරෙක් භික්ෂූන් නිවසකට පැමිණි පසු වාඩි වීමට ස්ත්‍රීන් සතු වස්ත්‍ර ආසන වලට එලති (පණවති). ඒවා අනාමර්ශ වස්තු වන්නේ ස්ත්‍රීන් පරිභෝග කරන කාලයේ දී පමණි. එය සුදුසු නැත.

දැව-බදාම ආදියෙන් කළ ස්ත්‍රී රූපයන් ද අනාමර්ශ වස්තූන් වෙති. මනුෂ්‍ය ස්ත්‍රී රූප පමණක් නොව තිරිසන් ස්ත්‍රී රූප ද ඇල්ලීම කැප නැත. විනෝදය පිණිස වුව ද ඇල්ලීමෙන් ඇවැත් වේ.

සප්තවිධ ධාන්‍යයෝ ද අනාමර්ශ වස්තූන් ය. හැල් හා සෙසු වී වර්ග, යව, තිරිඟු, තණ සහල්, වරා නම් ධාන්‍ය, අමු නම් ධාන්‍ය යන මේවා සප්තවිධ ධාන්‍ය නම් වේ. ඊට අමතර ව භික්ෂූන් වහන්සේලාගේ පරිභෝගයට ඇති ගස් වැල්වල ඇති පොල්, තල්, කොස්, මුං, මෑ ආදී ඵලදාව ද ස්පර්ශ කිරීම සුදුසු නැත.

මුතු, මැණික්, වෛරෑඩිමිණි, සක්, රන්, රිදී සහ මැණික් ලෙස සලකන වටිනාකමක් ඇති රත්නයන් ද අනාමර්ශ වස්තූන් ලෙස ගැනේ. රන්රිදී හා ඒවායින් කළ භාණ්ඩ ද මේ ගණයට ම ඇතුළත් අනාමර්ශ වස්තූන් ය.

සියලු ආයුධ අනාමර්ශ වස්තූන් ය. මෙහි ආයුධ යැයි අදහස් කළේ කඩු, දුනු, තුවක්කු, කිණිසි, හෙල්ල ආදී සටන් සඳහා ගන්නා භාණ්ඩය.

බෙර, දවුල්, තම්මැට්ටම්, වීණා, නළා ආදී සියලු තූර්ය භාණ්ඩයෝ ද අනාමර්ශ වස්තූන් වෙති.

මේවා ඇල්ලීමෙන් භික්ෂූන්ට ඇවැත් සිදු වේ. මෙය කෙටි විස්තරයකි. වැඩි විස්තර පිණිස විනය දන්නා භික්ෂුවකගෙන් අසා හෝ උපසම්පදා ශීලය[27] වැනි පොතක් කියවීමෙන් දැනගත හැක. මේවා ගිහි පින්වතුන් දැන ගැනීමෙන් භික්ෂූන් වහන්සේලාට පහසුවක් වේ යැයි සිතූ බැවින් මෙහි ඇතුළත් කළෙමි.

## 3. සිවුරු සම්බන්ධයෙන් දත යුතු කරුණු

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට සිවුරු නවයක් අනුදැන වදාරා ඇත. එයින් ප්‍රධාන තැනක් ගන්නේ සඞ්ඝාටිය, උත්තරාසඞ්ගය සහ අන්තරාවාසකය යි. සඞ්ඝාටිය නම් රෙදි පොටවල් දෙකක් යොදා මැසූ සිවුර යි. උත්තරාසඞ්ගය නම් රෙදි එක් පොටක් යොදා මැසූ සිවුර යි. අන්තරාවාසකය නම් අඳන සිවුර යි. මෙම තුන් සිවුර සෑම භික්ෂුවක් ළඟ ම තිබිය යුතු පිරිකරකි.

එයට අමතර ව වස්සිකසාටකය නම් චීවරය වස් වැසීම ආරම්භයේ පටන් වස් කාලය අවසන් වන තෙක් භික්ෂුව විසින් පරිභෝග කරන සිවුරකි. එය පාවිච්චි කළ හැක්කේ වස් කාලය තුළ පමණි. හිඳිනා ඇතිරිය හෙවත් නිසීදනය, සයනය කිරීමට ගන්නා ඇතිරිය හෙවත් පච්චත්ථරණය, කුෂ්ඨයක් වැනි රෝගයක් ඇති විට පරිභෝග කරණ කණ්ඩුපටිච්ඡාදිය, තුවායක් මෙන් පරිභෝග කරන මුඛපුඤ්ඡන චෝළය, අනෙකුත් දිගින් රියනටත් පළලින් වියතටත් වඩා විශාල වන සියලු ම රෙදි පරික්ඛාර චෝළය ලෙසත් ගැනේ. ඒ සිවුරු ඒ ඒ අවස්ථානුකූල ව පරිභෝග කළ හැක.

27 උපසම්පදා ශීලය, රේරුකානේ චන්දවිමල මහනාහිමි, 266 පිටුව.

## 3.1 සිවුරේ පැහැය

බුදුරජාණන් වහන්සේ පණවා ඇති සික්ෂාපද නිසා භික්ෂූන් වහන්සේලාට සිවුරු පූජා කිරීමේ දී ගිහියන් විසින් දත යුතු කරුණු කිහිපයකි. ප්‍රධාන වශයෙන් සිවුරු වල පාට ගැන සැලකිලිමත් විය යුතු ය. විනය දේශනාවට අනුව භික්ෂූන්ට කැප අකැප සිවුරු පාට මෙසේ යි.


සම්පූර්ණයෙන් නිල් පැහැ (දියබෙරලිය මල් පැහැ) ඇති, කහ පැහැ (කිණිහිරියා මල් පැහැ) ඇති, රතු පැහැ (බඳුවද මල් පැහැ) ඇති, මදටිය පැහැය ඇති, කළු පැහැය ඇති, පත්තෑයන්ගේ පිටේ පැහැය ඇති, ඉදුණු කොළවල පැහැය ඇති සිවුරු පරිභෝග කිරීම නො වටී. එසේ නම් උපාසකයා විසින් මේ කියන ලද වර්ණවලින් තොර ව කැප පාටින් සකස් කරන ලද චීවර පූජා කළ යුතු ය. කළු රතු ආදිය මිශ්‍ර වී ඇති කසට පැහැයට හුරු පාට සිවුරු සඳහා කැප බව සඳහන් ය. මෙසේ අකැප වර්ණයෙන් සිවුරු පූජා කළ හොත් ඒවා පරිභෝග කළ නො හැක. පරිභෝග කරන්නේ නම් එම සිවුරු සෝදා කැප වර්ණයක් ලැබෙන සේ පඬු[28] යොදා සකස්කර ගත යුතු ය. එසේ වර්ණය වෙනස් කිරීමට නො හැකි නම් ඒවා ඇතිරිලි ලෙස හෝ ජනෙල් රෙදි ආදී දෙයකට පරිභෝග කිරීම විනා සිවුරු පිණිස පරිභෝග කළ නො හැකි ය.

## 3.2 සිවුරේ ප්‍රමාණය

භික්ෂූන් වහන්සේලාට සිවුරු පූජා කිරීමේ දී සිවුරේ ප්‍රමාණය ගැන ඉතාමත් සැලකිලිමත් විය යුතු ය.

28 සිවුරු වල කැප වර්ණ සකස් කරගැනීමට පොතු තම්බා සකස් කරගත් දියරය.

බුදුරජාණන් වහන්සේගේ විනය නීතිවලට අනුව අධිෂ්ඨානයට සුදුසු සිවුරක ප්‍රමාණයක් දක්වා ඇත. එයට වඩා කුඩා සිවුර පරිභෝග කිරීම අපහසු ය. සිවුරේ දිග මුට්ඨිපඤ්චකයක් හෙවත් රියන් 4 ක් සහ මිටි රියන් එකකි. සිවුරේ උස වන්නේ මුට්ඨිතිකයක් හෙවත් රියන් 2 ක් හා මිටි රියනකි. මෙපමණට වඩා ප්‍රමාණයෙන් විශාල සිවුරු පමණක් පරිභෝග කළ හැකි ය. කුඩා වුව හොත් ශරීරය මනා ව ආවරණය වන සේ සිවුර පෙරවීම අපහසු ය.




රියනක් යනු වැලමිටේ සිට මැදගිල්ලේ කෙළවරට ඇති දුර ප්‍රමාණය යි. සිවුර මැනීම සඳහා මෙම රියන දැනගැනීම වැදගත් වේ.




මිටි රියනක් යනු අත මිට මොලවා ගත් කල වැලමිටේ පටන් නමාගත් ඇඟිලි කෙළවරට ඇති දුරයි. සාමන්‍ය රියනට වඩා අඟල් 4 ක් පමණ කුඩා වේ.

අඳනය දිගින් මුට්ඨිපඤ්චකයක් හෙවත් රියන් 4 ක් සහ මිටිරියනක් වන අතර පළලින් රියන් දෙකක් හෝ රියන් දෙකහමාරක් විය යුතු ය. මෙසේ සිවුරු පූජා


කිරීමේ දී ප්‍රමාණය ගැන සැලකිලිමත් විය යුතු ය. සිවුර මේ කියන ලද ප්‍රමාණයට වඩා මඳක් විශාල වූවාට කමක් නැත. ඉතා විශාල වුව හොත් පෙරවීමට අපහසු ය. ඒ නිසා භික්ෂූන් වහන්සේගේ රියනේ දිග අනුව සිවුරු පූජා කරන්නේ නම් සිවුර දිගින් රියන් 5 ක් හා පළලින් රියන් 4 හමාරක් වන සිවුර පෙරවීමට ප්‍රමාණවත් ය. (සාමාන්‍යයෙන් වඩා උසත් නැති මිටිත් නැති භික්ෂුවක් සඳහා දිගින් අඟල් 110ක් සහ පළලින් අඟල් 84ක් පමණ වන සිවුර ප්‍රමාණවත් ය.) එසේ ම අඳනය දිගින් රියන් 5 ක් හා පළලින් රියන් දෙකක් හෝ දෙක හමාරක් ප්‍රමාණවත් ය. (එය දිගින් අඟල් 86ක් හා පළලින් අඟල් 40ක් පමණ වීම ප්‍රමාණවත් ය.) මෙය පුද්ගලයාගෙන් පුද්ගලයාට රියනේ දුර ප්‍රමාණය වෙනස් වන බැවින් සිවුර ලබන භික්ෂුවගේ රියන කොපමණ ද යන්න ගැන සලකා බලා සිවුරු සකස් කළ යුතු ය. එසේ ම භික්ෂුවගේ උස මහත යන සියල්ල සිවුරු සැකසීමේ දී සැලකිය යුතු ය.

විශාල වුණත් සුගත සිවුරට වඩා විශාල නො විය යුතු ය. සුගත සිවුරට වඩා විශාල සිවුරු පරිභෝගය විනයට පටහැණි ය. (සුගත සිවුර ඉතා විශාල බැවින් සාමාන්‍ය පුද්ගලයන්ට පරිභෝග කිරීමට අපහසු ය. එය දිගින් සුගත වියත් නවයක් හා පළලින් සුගත වියත් සයකි. එය සාමාණ්‍ය පුරුෂ වියතෙන් දිගින් වියත් 27ක් සහ පළලින් වියත් 18කි.)

## 3.3 සිවුරුවල කඩ කැපීම

රෙදි කොටස්වලට කපා නැවත මසා ගැනීම කඩ කැපීම නම් වේ. මෙකල සිවුරු මිල දී ගැනීමේ දී නියමාකාරයෙන් කඩ කපා මැසූ සිවුරු සොයා ගැනීම ඉතා අපහසු ය. කඩ නො කැපූ සිවුරු පරිභෝග කිරීමට

අවසර නැත. කඩ පහක් හෝ ඊට වඩා හෝ කඩ කපා සකස් කළ සිවුරු පමණක් දැරීම භික්ෂූන්ට අනුදැන වදාරා ඇත. කඩ කැපූ අඳන සිවුර, කඩ කැපූ තනිපට සිවුර සහ කඩ කැපූ දෙපට සිවුර වශයෙනි. කඩ නො කැපූ සිවුරු දැරීම විනයානුකූල නොවේ.




1. කඩ
2. දිග් නුවා
3. හරස් නුවා
4. ජංඝෙයා (පටිය)
5. ගීවෙයා (පටිය)
6. ගණ්ඨිකය
7. ගණ්ඨි පාසකය
8. ගැබ[29]

ඉහතින් පෙන්වා ඇත්තේ සත්කඩ සිවුරකි. සත්කඩ නම් කොටස් වශයෙන් කඩ 7 ක් ලෙස කැපූ සිවුරකි. මෙම කඩ ගණන 5 හෝ ඊට වැඩි විය යුතු ය. කඩ ගණන ඔත්තේ සංඛ්‍යාවක් ද විය යුතු යැයි ආචාර්ය

29 මෙහි ගැබ නම් කැපූ රෙදි කැබලි එක් කොට මැසූ මැස්ම යි.

මතය යි. දළ වශයෙන් මේ පෙන්වා දී ඇති පරිදි සම්පූර්ණ වූ සිවුර විනයානුකූල සිවුරක් වේ.

මෙකල අටපිරිකර පූජා කිරීමේ දී ද එහි ඇති සිවුරු ගැන සැලකිලිමත් විය යුතු ය. බොහෝ අටපිරිකරවල ඇති සිවුරු පරිභෝග කිරීමට ප්‍රමාණවත් නැති ඉතා කුඩා ප්‍රමාණයේ හා වර්ණයෙන් ද අකැප ඒවා ය. එනිසා භික්ෂූන් වහන්සේලා එවැනි අටපිරිකර පරිභෝග කරන්නේ ම නැත. අටපිරිකර පූජා කොට පින් බලාපොරොත්තු වන්නෝ ඒ ගැන සැලකිලිමත් වෙත්වා.

## 4. පාත්‍ර සම්බන්ධයෙන් දත යුතු කරුණු

බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට විනය සිකපද පැණවීමේ දී පාත්‍රා වර්ග දෙකක් කැප බව දේශනා කොට වදාළ සේක. එනම් යකඩ පාත්‍රය සහ මැටි පාත්‍රය යි. මෙකල මැටි පාත්‍ර භාවිතා කරනුයේ ඉතා ස්වල්ප වශයෙනි. ඒ කැඩී බිඳී යාමට ඇති ඉඩකඩ වැඩි නිසාත් මෙකල නියම මැටි පාත්‍ර සොයාගැනීමට නො හැකි නිසාත් ය. රන්, රිදී, ඇට, ඇලුමිනියම් ආදී වෙන කිසිදු දෙයකින් සෑදූ පාත්‍රය, පාත්‍රයක් හැටියට භාවිතා කිරීම නුසුදුසු ය. මෙකල බොහෝ භික්ෂූන් භාවිතා කරන්නේ තායිලන්තයේ නිෂ්පාදිත සුදු යකඩ පාත්‍ර යි. එය ගින්නේ දමා පුළුස්සා විනයානුකූල පාත්‍රයක් ලෙස සකස්කරගත හැක. එසේ නො පිළිස්සූ සුදු පාත්‍රයත් අන් අමුද්‍රව්‍යකින් සෑදූ පාත්‍රයත් විනයානුකූල පාත්‍ර සංඛ්‍යාවට නො යයි. ඒවා ජලය ගැනීමට ආදී වෙනත් භාජනයක් ලෙස භාවිතා කිරීම විනා පාත්‍රයක් හැටියට පරිභෝග කිරීම යෝග්‍ය නොවේ.

## 4.1 පාත්‍රයේ ප්‍රමාණය

පාත්‍රාවල ප්‍රමාණ වශයෙන් දක්වන්නේ නම් ඉතා විශාල වූ පාත්‍රාත් ඉතා කුඩා වූ පාත්‍රාත් පාත්‍ර ගණයට නො යේ. භික්ෂූන්ට භාවිතා කළ හැකි වන්නේ මධ්‍යම ප්‍රමාණයේ පාත්‍රා පමණි. දළ වශයෙන් පාත්‍රයේ ප්‍රමාණය දක්වන්නේ නම්, හොඳින් වැඩුණු ශරීර ඇති නිරෝගී භික්ෂුවකට වරකට වැළඳීමට සෑහෙන ආහාර බහාලිය හැකි පාත්‍රය ඕමක[30] පාත්‍රය ලෙසත් දෙදෙනෙකුට සෑහෙන ආහාර දැමිය හැකි පාත්‍රය මධ්‍යම පාත්‍රය ලෙසත් සතර දෙනෙකුට ආහාර දැමිය හැකි පාත්‍රය උත්කෘෂ්ට[31] පාත්‍රය ලෙසත් සැලකිය හැකි ය. මෙකල භාවිතා වන පාත්‍ර බොහෝමයක් ඉහත කියන ලද ප්‍රමාණ තුනට අයත් ඒවා වේ. එම පාත්‍රත් යකඩ පාත්‍රය පස්වරක් ගින්නේ දමා පුළුස්සා ගැනීමෙනුත් මැටි පාත්‍රය දෙවරක් පුළුස්සා ගැනීමෙනුත් භික්ෂූන්ට පාත්‍රයක් හැටියට අධිෂ්ඨාන කොට භාවිතා කළ හැකි වන සේ විනයානුකූල පාත්‍රයක් සකස් කරගත හැකි ය.

මෙකල පූජා කරන අටපිරිකරයන්හි ඇත්තේ ඉතා කුඩා පාත්‍රය ය. එය පාත්‍ර ගණයට නො ගැනේ. සමහරවිට ඇලුමිනියම් පාත්‍රා ද එහි ඇත. එය ද පාත්‍ර ගණයට ඇතුළත් නොවේ. ප්‍රමාණයෙන් නිවැරදි වූ යකඩ හෝ මැටි පාත්‍රය ම පාත්‍ර ගණයට ගැනේ. ඒවා භික්ෂූන් වහන්සේලා විසින් ගින්නේ දමා පුළුස්සා තලතෙල් ආලේපකොට ගින්නෙන් රත්කොට කළු පැහැ ගන්වා සකස් කොට භාවිතා කරනු ලැබේ. එසේ හෙයින් පාත්‍ර පූජා කිරීමට කැමති ඔබ නියම වශයෙන්

30 අවම ප්‍රමාණය

31 උපරිම ප්‍රමාණය

සලකා බලා එය සිදු කිරීමෙන් පින් සිදු කරගත හැකි ය.

භික්ෂූන් වහන්සේලාට යම් යම් අවස්ථාවන් වල පාත්‍රය හැර අන් භාජනයන්හි දානය වැළඳීමට සිදුවන අවස්ථා ඇත. එයින් භික්ෂුවට ඇවතක් හෝ අකුසලයක් සිදු නොවේ. මෙම කරුණ නො දන්නා ගිහි පින්වත්හු අන්භාජනයක වැළඳීම සිකපද බිඳීමක් යැයි සලකා අකුසල් සිදුකර ගනිත්.

## 5. පාවහන් සම්බන්ධයෙන් දත යුතු කරුණු

බුද්ධ දේශනාවට අනුව භික්ෂූන්හට ගිහි පින්වතුන් මෙන් සෑම ආකාරයක ම පාවහන් පැළඳිය නො හැක. සම්පූර්ණයෙන් නිල් පැහැ ඇති, කහ පැහැ ඇති, රතු පැහැ ඇති, මදටිය පැහැය ඇති, කළු පැහැය ඇති, පත්තෑයන්ගේ පිටේ පැහැය ඇති, ඉදුණු කොළවල පැහැය ඇති පාවහන් දැරීම අකැප ය. සම්පූර්ණයෙන් නිල් පැහැ ඇති, කහ පැහැ ඇති, රතු පැහැ ඇති, මදටිය පැහැය ඇති, කළු පැහැය ඇති, පත්තෑයන්ගේ පිටේ පැහැය ඇති, ඉදුණු කොළවල පැහැය ඇති දාර ඇති පාවහන් දැරීම ද අකැප ය.

සම්පූර්ණයෙන් පිටිපතුල වැසෙන සේ පාවහන් දැරීම අකැප ය. එසේ ම කෙණ්ඩය දක්වා වැසෙන සේ මසා ඇති, විළුඹ වැසෙන සේ ඇති, පුළුන් පුරවා මැසූ, තිත්වටුපියාපතින් පිරියම් කළ, එළු අං වැනි සටහන් යෙදූ පටි ඇති, තිරෙළු අං වැනි සටහන් යෙදූ පටි ඇති, ගෝනුසු නගුටු ආකාරයෙන් පටි යොදා කළ, මොනර පිල්වලින් මසා කළ, විසිතුරු පාවහන් දැරීම ද අකැප ය. පාවහන් පූජා කිරීමේ දී ඒවා බලා වෛවර්ණ නො

වූ නොයෙක් මෝස්තර නො යෙදූ පාවහන් පූජා කිරීම නියම පාවහන් පූජාව වේ.

## 6. කුඩ සම්බන්ධයෙන් දත යුතු කරුණු

භික්ෂූන් වහන්සේලාට සේනාසනය තුළ කහ, රතු, නිල්, කළු ආදී සෑම කුඩයක් ම දැරිය හැක. සේනාසනයෙන් පිටත දී පරිභෝග කළ හැක්කේ තල් අතු වැනි පත්‍ර වලින් කළ කුඩයත්, සුදු කුඩයත් පමණි. නොයෙක් වර්ණයෙන් අලංකාර කළ මිටෙහි කැටයම් ආදිය ඇති කුඩය පරිභෝගය සඳහා සුදුසු නැත. සුදු කුඩයත්, පත්‍ර ආදියෙන් කළ කුඩයත් (මෙකල ගොටු අත්ත) ආරණ්‍ය ඇතුළත දීත් පිටත දීත් පරිභෝගයට සුදුසු බැවින් එවැනි කුඩ පූජා කිරීම සුදුසු ය. මෙකල තල් අතුවලින් සාදන ලද ගොටුඅතු සොයා ගැනීම ඉතාමත් දුෂ්කර ය. පින් කැමැත්තෝ එවැනි දේ පූජා කොට නිවන් මග පාදා ගනිත්වා.





ඇකිලීමට හා දිගහැරීමට හැකි වන සේ සැකසූ ගොටුඅත්ත

# 7. සයනය කිරීම පිළිබඳ දත යුතු කරුණු

මෙහි සයනය[32] කිරීම පිළිබඳ දැනගතයුතු කරුණු දෙයාකාර වේ. අනුපසම්පන්න පිරිමින් සිටින ගෙයක සයනය කිරීම සහ කාන්තාවන් සිටින ගෙදරක සයනය කිරීම යනු යි.

## 7.1 පිරිමින් සිටින නිවසක සයනය කිරීම

මෙහි ගෙදර යනු විවිධ වේ. සම්පූර්ණයෙන් වහලය සෙවිලි කළ, සම්පූර්ණයෙන් ආවරණය කළ ගෙය හා වැඩිහරියක්[33] සෙවිලි කළ, වැඩිහරියක් ආවරණය කළ ගෙය මේ සඳහා ගැනේ. බිත්ති ආදියක් නැති වහලය පමණක් ඇති මඩු ආදිය මේ සඳහා ඇතුළත් නොවේ. මෙසේ සඳහන් කළ ගෙයක අනුපසම්පන්න පිරිමින් සමග සයනය කළේ නම් දවස් තුනක් ඉක්මවා සතර වන දිනයෙහි සූර්යා අස්ථංගයට ගිය පසු භික්ෂුව සහ අනුපසම්පන්නයා සයනය කරන ඉරියව්වට පැමිණි කල්හි භික්ෂුව ආපත්තියකට පත් වේ. භික්ෂුව විසින් සෑම දිනක ම අරුණට පළමු ව අවදි වී නැගී සිටින්නේ නම් භික්ෂුවට ඇවැත් නොවේ. නමුත් යම් හේතුවක් නිසා භික්ෂුවට දින තුනක් අරුණට පළමුව අවදි වී ඇඳෙන් නැගී සිටීමට නො හැකි වුව හොත් එහි සිටින අනුපසම්පන්නයා ඇඳෙන් නැගී සිටිය යුතු ය. එවිට භික්ෂුව ආපත්තියෙන් මිදේ. බොහෝ අනුපසම්පන්නයන් සයනය කරන නිවසක එක් උපසම්පදා භික්ෂුවක් සයනය කළේ නම් සතරවන දවසෙහි සූර්යා අස්ථංගයට ගොස් ඇති විට ඒ අනුපසම්පන්නයන් ගණනට භික්ෂුවට ආපත්ති සිද්ධ

---

32 නිදා ගැනීම

33 වැඩිහරියක් යනුවෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් අදහස් වේ.

වේ. භික්ෂූන් වහන්සේලා සියයක් සයනය කරන නිවසක එක් අනුපසම්පන්නයෙක් සයනය කළේ නම් එම අනුපසම්පන්නයා නිසා ඒ සියලු ම භික්ෂූන්ට ආපත්ති සිද්ධ වේ.

දවස් දෙකකින් පසු ව තුන්වන දිනයේ අරුණ උදාවට කලින් භික්ෂුව විසින් හෝ අනුපසම්පන්නයා විසින් අවදි වී නැගී සිටියේ නම් භික්ෂුවට ආපත්ති සිද්ධ නොවේ. එසේ දින තුනකට වරක් භික්ෂුව හෝ අනුපසම්පන්නයා අවදි වී නැගී සිටිය යුතු ය. දිනපතා අරුණට පළමු ව අවදි වන්නේ නම් කිසි දිනක ආපත්තියක් සිදු නොවේ. මෙහි අවදි වීම ම ප්‍රමාණවත් නොවේ. අනිවාර්යයෙන් ම සයනය කරන ඉරියව්වෙන් මිදී සිටගෙන හෝ හිඳගෙන සිටිය යුතු ය. අවදි වුව ද සයනය කරන ආකාරයෙන් ම සිටීමෙන් ද ආපත්තිය සිද්ධ වේ. යම් හෙයකින් භික්ෂුවගේ ගිලන් කමක් නිසා හෝ අරුණට පළමු ව අවදි වීමට නො හැකි නම් ඒ බව අනුපසම්පන්නයා අවබෝධ කොටගෙන භික්ෂුවට ආපත්තියක් සිද්ධ නොවන ආකාරයට හැසිරීමට වග බලාගත යුතු ය. එබැවින් භික්ෂූන් ඇසුරු කරණ ගිහි පින්වතුන් මේ පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

### 7.2 කාන්තාවන් සිටින නිවසක සයනය කිරීම

කාන්තාවක් ඇති නිවසක සයනය කිරීමේ දී අඳුරු වැටුණු වේලේ පටන් පසු දා එළිය වැටෙන අතර කාලය තුළ එක් මොහොතකට හෝ දෙදෙනා ම (භික්ෂුව හා කාන්තාව) එකවර එක ම නිවසේ දෙපොළක හෝ සයනය කළ හොත් භික්ෂුවට මෙම ආපත්තිය සිද්ධ වේ. මෙහි දී කලින් සඳහන් කළ ලෙස දින ගණන හෝ අරුණ වැදගත් නොවේ. පළමු දිනයේ ම අඳුරු වැටුණු මොහොතේ පටන් ආපත්ති සිද්ධ විය හැකි ය.

විශේෂයෙන් ම මෙය සැලකිය යුත්තේ භික්ෂූන් නිවෙස්වලට පැමිණි පසු පිරිත් කීමේ දී අසුන් පැණවීම හෝ චාරිකාවේ වඩින අවස්ථාවල සැතපීම සඳහා ස්ථානයන් සකස් කිරීමේ දී ය.

බොහෝ කාමර ඇති යම් නිවසක ඇතුළු වීමට හා පිටවීමට ඇත්තේ එක් දොරක් හෝ දෙකක්, තුනක් නම් එම නිවසේ කොතනක හෝ කාන්තාවක් සයනය කරන්නේ නම් එහි වෙනත් කාමරයක හෝ භික්ෂුවකට සයනය කළ නො හැක. තට්ටු ගණනක නිවසක වුව ද ඉහළ තට්ටුවලට ඇතුළු වීමට ඇත්තේ පහළ කොටසේ ඇතුළතින් නම් මේ ආපත්තිය සිද්ධ වේ.

මෙහි දී සැලකිය යුතු කරුණක් නම් නිවසක් වැනි ඉදිරිපසින් හා පිටුපසින් දොරවල් තිබුණ ද ඇතුළත කාමරවලට යෑමට ඇත්තේ ගේ ඇතුළතින් නම් එවැනි තැන්වල ද මේ කියන ලද ආකාරයට සයනය කළ නො හැකි බව යි. කාමරයේ දොර විවෘත ස්ථානයකට ඇත්නම් එම දොරෙන් නිවසින් එළියට ම පැමිණීමට හැකියාව ඇත්නම් (එම නිවසේ වැරැන්ඩාවකට හෝ සම්බධ වී නැති නම්) එවැනි කාමරවල සිටීමෙන් ඇවැත් සිද්ධ නොවේ. සමහර නිවෙස්වල පළමු කාමරයේ දොර විවෘත වන්නේ නිවස ඇතුළට නොව පිටතට යි. නමුත් එය වැරැන්ඩාවට සම්බන්ධ වේ. එවැනි නිවසක කාන්තාවන් සයනය කළත් පළමු කාමරයේ භික්ෂුවකට සයනය කළ නො හැක.

මහල් කිහිපයක නිවසක උඩ මහල ඇතුළතින් සම්බන්ධයක් නැති ව පිටතින් යාමට හැකිනම් එහි ද උඩුමහලේ කාන්තාවක සිටිය ද යට මහලේ භික්ෂුවකට සයනය කළ හැකි ය. හෝටල්, රෝහල් වැනි තැන්වල ප්‍රධාන දොරෙන් ඇතුල් වී කාමරවලට යෑමට දොරවල්

ඇත. එවැනි තැනක භික්ෂූන් වහන්සේලාට හා කාන්තාවන්ට එකට සයනය කළ නො හැක. මෙම සහසෙය්යාව සිදු වීමට බොහෝ තැන් වල අවකාශ ඇත. එම නිසා භික්ෂූන් වෙනුවෙන් නිවසෙන් වෙන් වූ කුඩා කුටියක් තිබීම හෝ භික්ෂුව සිටින දිනවල ස්ත්‍රීන් එම නිවසේ නිදාගැනීමෙන් වැළකීම යෝග්‍ය වේ.

මෙම සිකපදයේ දී මව, සහෝදරිය නිසා වුව ද ආපත්ති සිද්ධ වේ. එදින ම උපන් දැරියක වුව ද එක් නිවසක සයනය කළේ නම් ආපත්තිය සිද්ධ වේ. එම නිසා උපසම්පදා භික්ෂූන් වහන්සේලාට ආසන පැණවීමේ දී මේ පිළිබඳ වඩාත් අවබෝධයක් ඇති ව කළ යුතු ය.

## 7.3 දිවා සයනය

ඉහත කී සයනය කිරීම සම්බන්ධ ආපත්තීන් දිවා සයනයේ දී අදාළ නොවේ. දිවා සයනයේ දී අනුපසම්පන්නයන් හා කාන්තාවන් සහිත නිවසක වුව ද සයනය කිරීමෙන් ආපත්තියක් සිද්ධ නොවේ. දිවා සයනය කිරීමේ දී සැලකිය යුතු කරුණක් නම් දොරක් සහිත ස්ථානයක සයනය කිරීම යි. දොර වැසීමට අපහසු නොවන තැනක දොර වැසීම අනිවාර්ය වේ. දොර අගුලු නො දැම්මත් මිනිසෙකුගේ හිස ඇතුළු නො කළ හැකි පරිදි දොර වසා සයනය කළ යුතු ය. දිවා සයනය සඳහා ආසන පිළියෙළ කරන ගිහිපින්වතුන් ආවරණයක් ඇති තැනක සයනය කිරීමට සකසා දීම භික්ෂූන්ට යෝග්‍ය වන බව දත යුතු ය. දිවා සයනය කරන ස්ථානයේ දොර වැසීමට නො හැකි නම් වෙනත් භික්ෂුවක් හෝ විශ්වාසවන්ත (පිරිමි) කැපකරුවෙකු නො නිදා (මුරට මෙන්) සිටිය යුතු ය.

### 7.4 භික්ෂූන් උදෙසා ආසන පැණවීම

භික්ෂූන් සේනාසනයෙන් පිට ව වෙනත් කටයුතු සඳහා යෑමේ දී රාත්‍රී කාලය සේනාසනයෙන් පිටත ගත කිරීමට සිදුවන අවස්ථා ඇත. එවැනි අවස්ථාවල දායකයන් ආසන පැණවීමේ දී දැනගත යුතු දෙයක් නම් භික්ෂූන් දෙනමකට එක ම ඇඳක, එක ම ඇතිරියක සයනය කිරීමට නො හැකි බව යි. එවැනි වේලාවේ දී වෙන වෙන ම ආසන පැණවීමට උත්සාහ කළ යුතු යි. එසේ නො හැකි නම් දෙදෙනෙකුට නිදාගත හැකි ප්‍රමාණයේ ඇඳක මැදින් පටියකින් හෝ යම් දෙයකින් බෙදා ආසන පැණවීම ද කළ හැකි යි. එසේ කිරීමේ දී කිසිසේත් එක ඇඳක ආසන දෙකට වඩා පැණවීම යෝග්‍ය නොවේ. භික්ෂූන් වහන්සේලා තුන් නමකට වඩා වැඩි ප්‍රමාණයකට එක ඇඳක නිදා ගැනීම විනය විරෝධී වේ. එම නිසා ආසන පැණවීමේ දී ඒ කරුණ ගැන ද සැලකිලිමත් විය යුතු ය.

තවත් වැදගත් කරුණක් නම් භික්ෂූන් වහන්සේලා බස්වල ගමන් කරන අවස්ථාවන් වල දී ආසනයේ අනෙක් පසින් කාන්තාවන් වාඩි වීම යි. එසේ වාඩි වීමෙන් ද භික්ෂූන් වහන්සේ ආපත්තියට ලක් වේ. තිදෙනෙක් හිඳ ගැනීමට හැකි දීර්ඝ ආසනයේ වුව ද කාන්තාවක් හිඳ ගැනීම යෝග්‍ය නොවේ.

## 8. භික්ෂූන් හමුවට පැමිණෙන ගිහි පින්වතුන් දත යුතු කරුණු

### 8.1 කාන්තාවන් සමග හුදකලා වීම

හුදකලා වූ කාන්තාවක් භික්ෂුවක් සමඟ කතා කිරීම ආදී කටයුතු කිරීමෙන් ද භික්ෂුවට ඇවැත් සිදුවිය හැක. එම නිසා කාන්තාවන් විහාර සෙනසුන්වලට පැමිණීමේ

දී දැනුම් තේරුම් ඇති පිරිමි කෙනෙකු සමග පැමිණිය යුතු යි. දැනුම් තේරුම් යනු, දැනුම් තේරුම් වයසේ සිටින දරුවෙකු හෝ වැඩිමහල් පුද්ගලයෙකු නම් කන් ඇසෙන, ඇස් පෙනෙන, මන්දබුද්ධික නොවන, යමක් තේරුම් ගැනීමට අපහසු නොවන තරමේ කෙනෙකු විය යුතු යි. ඒ පැමිණෙන පුද්ගලයා අඩු ම තරමින් රියන් දොළසක් (අඩි 18 ක්) අතර හෝ ඇසෙන මානයේ සිටිය යුතු යි. ඒ පුද්ගලයා නිදා සිටින්නේ නම් එයින් ද කාරණය සම්පූර්ණ නොවේ. නො නිදා සිටින සිහිකල්පනාව ඇති යමක් තේරුම් ගැනීමට හැකි පුද්ගලයෙක් සිටීමෙන් භික්ෂුවකට කාන්තාවක සමග ආපත්තියකින් තොර ව කතා කළ හැක.

## 8.2 කාන්තාව භික්ෂුවගේ කය ස්පර්ශ කිරීම

භික්ෂූන් වහන්සේ නමක් වෛද්‍යවරයෙකු හමුවට පැමිණෙන අවස්ථාවේ දී කාන්තා වෛද්‍යවරියක විසින් භික්ෂුවගේ කය ස්පර්ශ කිරීමේ දී භික්ෂුවට ඇවැත් සිදුවිය හැකි ය. එසේ සිදු වන්නේ භික්ෂුවගේ සිත අනුව ය. කෙසේ වෙතත් කාන්තාව භික්ෂුවට විනය ආරක්ෂා කරගැනීමට උපකාර කරන්නේ නම් භික්ෂුවගේ පක්ෂයෙන් එය තවත් පහසු වේ. එවැනි අවස්ථාවක නිරාවරණය වූ කයෙන් කය නො ගැටෙන පරිදි වෛද්‍යවරිය හෝ හෙදිය විසින් අත් වැසුම් භාවිතා කිරීමෙන් භික්ෂුවට විනය සැක දුරු කරගත හැක.

භික්ෂූන් විසින් කාන්තාවන්ගේ අත්වල පිරිත් නූල් බැඳීම සිදු නො කරන්නේ ද කාන්තාවන්ගේ ශරීර ස්පර්ශ වීමට අවකාශ ඇති බැවිනි. එබැවින් කාන්තාවෝ ඒ කාරණය ද වටහාගෙන කටයුතු කරත්වා.

## 8.3 කාන්තාවන් සමග සංවිධානය වී ගමන් යෑම

භික්ෂුවකට කාන්තාවක සමග සංවිධානය වී ගමන් යෑම අකැප ය. එවැනි අවස්ථාවක ගමන් සංවිධානය කරන කාන්තාවන් ඒවා නිසි පරිදි යොදාගෙන භික්ෂුවට දැනුම් දීමෙන් ඇවැතට පත් නොවේ. භික්ෂුව කාන්තාවට වෙලාව දිනය ආදිය සංවිධානය කොට දැන්වීම යෝග්‍ය නොවේ. කාන්තාවන් හෝ සිල් මාතාවන් සිදු කරන චාරිකා සංවිධානයේ දී මේ පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

එසේ ම භික්ෂූන් වහන්සේලාට උපදෙස් දීම යම් යම් දේ සඳහා අණකිරීම ආදී දේ හේතුවෙන් ද ගිහි පින්වතුන්හට අකුසල් වන බැවින් ඒ පිළිබඳ ව ද සැලකිලිමත් විය යුතු ය.

## 8.4 ගිහි පින්වතුන් සෙනසුනක දී හැසිරිය යුතු ආකාරය

තවත් කාරණයක් නම් දායක පින්වතුන් විසින් භික්ෂූන් වාසය කරන කුටි සෙනසුන් වෙත යෑමේ දී සිදු වන යම් යම් අතපසු වීම් ය. භික්ෂුව වසන සේනාසනයට ගොස් තමන්ට කැමති සේ එහි භාණ්ඩ පරිහරණය කිරීම යෝග්‍ය නොවේ. සිදු කරන සෑම දෙයක් ම එහි වසන භික්ෂුවගේ අවසරය මත කිරීම සුදුසු ය. දොර ජනෙල් ඇරීම, වැසීම, විදුලි බල්බ දැල්වීම, නිවීම ආදි සියලු දේ අවසර ගෙන ම කිරීමෙන් ඒ භික්ෂුව වෙත ඇති ගෞරවය ආරක්ෂා වේ. එසේ ම කුටි සෙනසුන් පිරිසිදු කිරීමේ දී ඒවායේ ඇති භාණ්ඩ තිබූ තැනින් ම තැබීමට උත්සාහ කළ යුතු ය. පාපිසි කොසු ආදිය ගත් තැනින් තැබීමෙන් භික්ෂුවට වුව ද අපහසුවකින් තොර ව වැඩ සිටීමට කරන උපකාරයකි.

සෙනසුනේ ඇති උපකරණ භාවිතයේ දී භික්ෂූන්

වහන්සේගේ අවසරය ඇති ව ම ඒවා පාවිච්චි කිරීමට වග බලාගත යුතු ය. සමහරෙක් සෙනසුන්වලට ගොස් භික්ෂූන් පරිහරණය කරන ඇඳ පුටු ආදිය පරිභෝග කරති. එය එසේ කිරීමෙන් භික්ෂූන් වහන්සේලාට ඇති ගෞරවය අඩු වනවා සේ ම ගිහි පින්වත්හු අකුසලයක් ද රැස් කර ගනිති. භික්ෂූන් වහන්සේලා සතු භාවිතයේ දී ද ඒවා අපිරිසිදු නොවන සේ පරිභෝග කළ යුතු යි. හැකි සෑම විට ම භික්ෂූන් වහන්සේලාගේ වැසිකිළි ආදිය පරිභෝග නො කර අන් තැනක් සොයා ගත හැකි නම් ඒ තැන් භාවිතා කිරීම යෝග්‍ය වේ. සෑම විට ම සංඝයාගේ දේපළට හානියක් නොවන සේ පරිභෝග කිරීමට වග බලා ගත යුතු ය. සංඝයාගේ දේපළ විනාශ කොට සසර දුක් විඳි කතා ත්‍රිපටකයේ බොහෝ විස්තර කර ඇත.

විශේෂයෙන් ම කිය යුතු තවත් කාරණයක් නම් සෙනසුන් වල භික්ෂූන් වහන්සේලා හමුවට යන ගිහි පින්වතුන් සංවරව ගෞරව පෙරදැරි ව යා යුතු බව යි. තමන්ගේ ඇඳුමෙන් පවා සංවර භාවය පෙනෙන බැවින් ඒ ගැන සැලකිලිමත් විය යුතු ය. දානය බෙදන අවස්ථාවන් වල දී කාන්තාවන් කොණ්ඩය කඩා නො දමා කෙස් ගස් ආදිය නො වැටෙන සේ සකස් කර ගත යුතු ය. භික්ෂූන් සමීපයට යන පින්වතුන් භික්ෂුවට අපහසුවක් වන තරමට සමීපයට නො යා යුතු ය. සෑම විට ම භික්ෂූන් වහන්සේලාගේ පහසුව ම ප්‍රාර්ථනා කළ යුතු ය.

# 9. පොළොව කැණීම සහ ගස් කැපීම සම්බන්ධයෙන් දත යුතු කරුණු

## 9.1 පොළොව කැණීම

භික්ෂුවකට පොළොම සෑරීම හෝ තවත් කෙනෙකු ලවා සෑරවීම, ගින්නෙන් දැවීම හෝ වෙනකෙකු ලවා දැවවීම කළ හැකි කැප ක්‍රම සහ අකැප ක්‍රම ඇත. උදාහරණයක් ලෙස භික්ෂුවකට වළක් සාරාගැනීමට අවශ්‍ය වන වෙලාවක අනුපසම්පන්නයෙකු ලවා එය කරවා ගත යුතු ය. එසේ කරගත යුතු අවස්ථාවේ තැනක් පෙන්වා “මෙතන වළක් කණින්න, වළක් සාරන්න” යනාදී වශයෙන් අණ කිරීමත් භික්ෂූන්ට ආපත්ති වීමට කාරණයකි. ඒ විනය දේශනාවට අනුව අකැප ව්‍යවහාර නො ගැළපෙන නිසා ය. එවන් අවස්ථාවක දී භික්ෂුවට කිව හැක්කේ “මෙතනට වළක් අවශ්‍ය ව ඇත, වළක උවමනාවක් ඇත, වළක් තිබ්බොත් හොඳයි, මෙතනට වළක් දැනගන්න” යනාදී වක්‍රාකාරයෙනි. එසේ කියූ පසු ප්‍රඥාවන්ත අනුපසම්පන්නයා භික්ෂුවගේ අදහස දැනගෙන ක්‍රියා කළ යුතු ය. පොළොවේ කාණුවක්, සිදුරක් සාදා ගැනීමට ද ක්‍රියා කළ හැක්කේ එලෙස ම ය.

## 9.2 ගස් කැපීම

භික්ෂුව ගස් කැපීම, මල් ගෙඩි කැඩීම, කොළ කැඩීම, පැළ ගැලවීම, ගස් පොතු තුවාල කිරීම, තැලීම ආදී කිසිදු ආකාරයේ දෙයක් නො කළ යුතු ය. එසේ ම ගස් වැල් ගිනිතබා පුළුස්සා ඇමීම ද නො කළ යුතු ය. අඩු ම තරමින් සේපාලිකා වැනි ගසක මල් සඳහා සෙලවීම පවා භික්ෂුවකට කැප නොවේ. ඒවා අනුපසම්පන්නයන් ලවා කරවා ගැනීමේ දී ඉහත කී

පොළොව කැණීම සම්බන්ධ ව කීවා සේ වක්‍රාකාරයෙන් ම කිව යුතු ය. කෙළින් ම අණ කිරීමක් සිදු නො කළ යුතු ය. භික්ෂුවකට යම් අත්තක් කපා ගැනීමට අවශ්‍ය නම් "මේ අත්ත දැනගනුව, මට මේ අත්තෙන් වැඩක් ඇත, මේ අත්ත තිබීම මෙතනට කරදරයි, අත්ත මෙතනට වැඩක් නැත" යනාදී වශයෙන් වක්‍රාකාරයෙන් කී විට නුවණැති අනුපසම්පන්නයා ඒ බව දැන වහා ම ඉවත් කිරීමට වග බලාගත යුතු ය. පොළොවේ සිටුවන ලද හෝ කඳෙන් වෙන් නො කරන ලද ගස් ආදිය කප්පියං කළ නො හැක. එසේ කප්පියං කළ ද කැප කිරීම සිද්ධ නොවේ.

අනුපසම්පන්නයා ගසෙන් කපා වෙන්කරන ලද අත්තක් වැල්වල පැටලී ඇත්නම්, එය පහළට ඇද දැමීම ද භික්ෂුවකට කළ නො හැක. ඒ මන්ද යත් එහි පැටලී ඇති වැල් ආදිය කැඩීම නිසා භික්ෂුවට ආපත්ති සිදුවිය හැකි බැවිනි. එවැනි අවස්ථාවල දී භික්ෂුවට උදව් කළ නො හැක. අනුපසම්පන්නයකු ම එය ඇද දැමිය යුතු ය. බිමට ඇද දැමූ අත්තක් ගෙනගොස් වෙනත් තැනකට විසිකිරීමට භික්ෂුවකට හැක. එම කැපූ අතු නැවතත් පැළවෙන තත්ත්වයේ ඇත්නම් ඒවා කොටස්වලට කැපීම ද භික්ෂුවට කළ නො හැක. ඒවා ඉහත කී ලෙසින් කැපකරවා ගත යුතු ය. එසේ කැප කර ගැනීමෙන් භික්ෂුවට රිසි සේ එම අතු කපා වෙන් කරගත හැක. එසේ කප්පියං කිරීමේ දී අත්තේ ප්‍රමාණය මහත් නම් එය ඔසවන්නේ නැති ව ම අනුපසම්පන්නයාට කැපකර දිය හැක. පැළ නොවෙන වියළුණු දර වැනි දෙයක් නම් කැපකර දීමක් අවශ්‍ය නැත. මෙසේ එක් වරක් කැපකර දීමෙන් සියලු ම භික්ෂූන් වහන්සේලාට එය කපන්නට හැකි ය. එම කැපකළ දෙය නැවතත් දළු හෝ මුල් ආදිය දමා

වෙනසක් සිදු වූයේ නැත්නම් නැවතත් කැප කළ යුතු නොවේ. ඉඟුරු ආදිය කප්පියං කර තබා දින කිහිපයක් ගත වීමෙන් එය පැළවී මුල් දමා වෙනස් විය හැක. එසේ වෙනස් වුව හොත් නැවතත් කප්පියං කරගත යුතු ය.

ජලයේ පාවෙන පාසි ආදිය ද එසේ ම ය. ඒවා ජලයෙන් ඉවත් කිරීමට භික්ෂුවකට නො හැක. ඒවා ද අනුපසම්පන්නයන් කළ යුතු දේවල් ය. තෙතමනය ඇති තැන්වල සෑදෙන දියසෙවෙල ආදිය ද මේ ක්‍රමයෙන් ම දත යුතු ය.

මේ සිකපදය භික්ෂූන්ට පණවා ඇත්තේ ගස්වැල් කැපීම නිසා පවක් සිදුවෙන නිසා නොව මිනිසුන් භික්ෂූන් කෙරෙහි කලකිරී අකුසල් කරගැනීමෙන් වැළකීම පිණිස ය. බුද්ධ කාලයේ මිනිසුන් ගස්වැල් ඒකීන්ද්‍රිය[34] ප්‍රාණීන් ලෙස සලකා ඇත. එසේ ඇති කල්හි භික්ෂූන් ගස්වැල් නැසූවිට ඒකීන්ද්‍රිය ප්‍රාණීන් නසත් යැයි භික්ෂූන් කෙරෙහි කලකිරී ඇත. එසේ හෙයින් මෙම සිකපදය පනවා මිනිසුන් හට අකුසල් සිදුවීම වළක්වා ඇත. මෙසේ සිකපද පණවා ඇති කල්හි භික්ෂූන්ට තණ ආදිය ඉවත් කරගැනීමට නො හැකි වීමෙන් නොයෙක් කරදයන්ට මුහුණ පෑමට සිදුවිය. එමනිසා බුදුරජාණන් වහන්සේ වක්‍රාකාරයෙන් කියා එවැනි දේ කරගැනීමට හැකිවන සේ මෙම සිකපදය මදක් ලිහිල් කොට ඇත.

මෙකල මිනිසුන් චෝදනා කොට අකුසල් කර නො ගත්ත ද බුදුන්වහන්සේ විසින් පණවන ලද සිකපද වෙනස් නො කළ හැකි බැවින් ඒවා ඒ ආකාරයෙන් ම

34 එක ඉන්ද්‍රියක් ඇති (අතීතයේ මිනිසුන් ගස් වැල් එක් ඉන්ද්‍රියක් ඇති ප්‍රාණීන් ලෙස සැලකූහ.)

ආරක්ෂා කිරීම භික්ෂූන් සතු යුතුකමකි. සමහරෙක් මෙවැනි අවස්ථාවන් වලදී "භික්ෂූන් වහන්සේලා වැඩකට නැති දෙයක් කරත්" යැයි විනය පහත් කොට සලකා අකුසල් රැස් කර ගනිති. එයින් වැළකී භික්ෂූන් වහන්සේලාගේ විනය ආරක්ෂා කර ගැනීමට හැකි උපකාරයක් කිරීමෙන් කුසල් වඩා ගත හැක. එය මනා ව අවබෝධකොට භික්ෂූන්ගේ විනය සිකපද ආරක්ෂා කරගැනීමට උපකාර කරත්වා.

## 10. බෙහෙත් සම්බන්ධයෙන් දත යුතු කරුණු

යම් භික්ෂුවක් ගිලන් වූ අවස්ථාවක එම භික්ෂුවට අවශ්‍ය වන බෙහෙත් ද්‍රව්‍යය දායක පින්වතුන් සම්පූර්ණ කරන්නේ නම් එය භික්ෂුවට පහසුවකි. දායකයන්ගේ පැවරීමකින් තොර ව ගිලන් භික්ෂුවකට, හැකියාව ඇති ඕනෑ ම කෙනෙකුට කියා බෙහෙත් ගෙන්වා ගැනීමට විනයෙන් අවසර ලැබේ. එම නිසා ගිලන් භික්ෂුවක් බෙහෙත් ඉල්ලීමක දී ඒ ගැන අකුසල් සිත් නොම උපදවා හැකි නම් උදව් කිරීම ඔබ සතු ගුණාංගයකි.

### 10.1 ඉල්ලීම

භික්ෂුවකට යම්කිසි සිව්පසයක (සිව්පසය නම් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස කියන සතරටයි. භික්ෂූන් සතු සියලු පිරිකර මේ සතරට ඇතුලත් වේ.) අවශ්‍යතාවයක් ඇති වුව හොත් සෑම කෙනෙකුගෙන් ම ඉල්ලිය නො හැක. විනය ප්‍රඥප්තීන් අනුව භික්ෂුවට ඉල්ලිය හැක්කේ සීමිත දෙනෙකුගෙන් පමණි. ඒ දෙමාපියන්, ලේ ඥාතීන් හා කැපකරුවන් යන අය යි. ඊට අමතර ව ඉල්ලිය හැක්කේ පැවරීමක් කර ඇති අයගෙන් පමණි. පැවරීම යනු ගිහි පින්වතුන් භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතාවයන් සැපිරීම පිණිස භික්ෂූන් වහන්සේලා වෙත කෙරෙන ආරාධනයකි.

එසේ පැවරීමක් සිදුකර නොමැති නම් භික්ෂුවක් තමාට අවශ්‍ය කරන දේ ඉල්ලීම යෝග්‍ය නොවේ. ඉහත කී ආකාරයට ගිලන් බවක් ඇත්නම් එසේ පැවරීමක් නැති ව ම බෙහෙත් ආදිය ඉල්ලිය හැක. අන්‍ය වූ දේ ඉල්ලිය නො හැක.

එසේ පැවරීම කරන්නේ නම් දායක පින්වතුන්ගේ හැකියාව මත සිදු කළ යුතු ය. “ඔබ වහන්සේට අවශ්‍ය දෙයක් ඇත්නම් පවසන සේක්වා” යනුවෙන් හෝ කාල පරාසයක් ඇති ව “මේ තුන්මස තළ ඔබ වහන්සේට අවශ්‍ය යමක් ඇත්නම් පවසන සේක්වා” හෝ වර්ගයක් නියම කොට “ඔබ වහන්සේට සිවුරු අවශ්‍ය වුව හොත් පවසන සේක්වා” යනාදී වශයෙන් තමන්ගේ උදව් කළ හැකි ශක්ති ප්‍රමාණය මත මෙම පැවරීම සිදුකිරීම යෝග්‍ය වේ. “ඔබ වහන්සේට ජීවිතාන්තය දක්වා අවශ්‍ය ඕන ම දෙයක් වෙතොත් පවසන සේක්වා” යනුවෙන් ද කාලයක් නොමැති ව වුව ද පැවරිය හැක. එසේ පැවරීම පැහැදිලි ලෙස නො වුව හොත් භික්ෂුව අපහසුතාවයකට පත් විය හැක.

සමහර දායක පින්වත්හු දකින දකින භික්ෂූන් වහන්සේලාට පැවරීම කළ ද යමක් ඉල්ලූ විට ඒ දෙය කර දීමට සමත් නො වෙති. එසේ පැවරූ සමහරෙක් නැවතත් භික්ෂූන් හමුවට නො යති. එසේ කිරීමෙන් භික්ෂුව අපහසුතාවයට ලක් වේ. එම නිසා පින්වත් ඔබ කල්පනාකාරී ව තමන්ට හැකි අයුරින් පැවරීම සිදු කරන්නේ නම් භික්ෂූන් වහන්සේලාට ද අපහසුවකින් තොර ව කටයුතු කරගැනීමට හැක. යම් කෙනෙකුට අපහසුවක් ඇත්නම් පැවරීමක් නො කර සිටීම ද වරදක් නොවේ. එය තම තමන්ගේ කැමැත්ත අනුව සිදු කළ හැක.

# 11. සඟසතු පිරිකර සම්බන්ධයෙන් දත යුතු කරුණු

සඟසතු පිරිකර නම් සංඝයාට අයත් පිරිකර ය. බොහෝ දෙනා සඟසතු දේවල් පිළිබඳ ගරු කොට නො සලකති. එම නිසා එයින් බොහෝ අකුසල් ද රැස්කර ගනති. සඟසතු දේපල කොටස් දෙකකි. එනම් ගරු භාණ්ඩ හා ලහු භාණ්ඩ ය.

## 11.1 ගරු භාණ්ඩ

ගරුභාණ්ඩ යනු යම් දෙයක් සඟසතු කොට පූජා කළ පසු එය නැවත පුද්ගලික ව පරිභෝග කළ නො හැකි දේවල් ය. ඒවා සදාකල් සඟසතු පිරිකර ය. එම ගරුභාණ්ඩ ගිහියන් පරිහරණය කරන විට සැලකිලිමත් විය යුතු ය. ඒවා කොටස් පහකට බෙදා වර්ග විසිපහකින් දක්වා තිබේ.

1. ආරාම සහ ආරාම වස්තු - ආරාමය යනු සඟසතු කොට පූජා කරන ලද කෙත්වතු, ඉඩම් ආදිය යි. ඒවායේ ඇති ගස්කොළන්, කුටිගෙවල්, පස්, ගල් ආදිය ආරාම වස්තු යි. මෙසේ ඉඩමේ ඇති සියලු දේ ආරාම වස්තු හැටියට සැලකේ.

2. විහාර සහ විහාර වස්තු - යම් කුටිගෙයක් විහාරයක් හැටියට සඟසතු කොට පූජා කළ පසු එය විහාරය ලෙසත් විහාරයේ ඇති උපකරණ ආදිය විහාර වස්තු ලෙසත් හැඳින් වේ.

3. ඇඳ, පුටු, ගුදිරි[35], කොට්ට - යනාදිය සඟසතු කොට පූජාකිරීමෙන් පසු නැවතත් පුද්ගලික භාවයට පත් කළ නො හැකි ය. මෙහි ඇඳ පුටු ආදියට අනුලොම් වන මේස, කබඩ්, රාක්ක ආදිය ද සඟසතු කොට

35 මෙට්ට

පූජා කළ හොත් නැවත බෙදීමක් කළ නො හැක. එසේ අනුලොම් ව යන පරිෂ්කාර ද මෙයට ඇතුළත් කළ යුතු වේ.

4. ලෝහසැළි, ලෝහකටාරම්, ලෝහජෝගු, ලෝහකල, වෑ, පොරෝ, කෙටේරි, උදලු ආදී සෑරීමේ උපකරණ යන ඒවා ද ඒවාට අනුලොම් වන භාණ්ඩ ද මෙම ගණයට ඇතුළත් වේ. මේවා ද සඝ සතුකොට පූජා කළ පසු සංඝික පරිභෝගයෙන් ම පරිභෝග කළ යුතු යි.

5. වැල්, උණ, මුඤ්ජ නම් තණ, බබුස් නම් තණ, ගෙවල් සෙවෙලි කිරීමට ගන්නා අන්‍ය වූ තෘණ වර්ග, මැටි, ලීබඩු, මැටිබඩු යන මේවා ද ගරුභාණ්ඩ වේ. මෙකල සෙවිලි කිරීමට ගන්නා පොල් අතු, පිදුරු ආදිය ද මෙයට අනුලොම් වේ. මේවා සඟසතු කොට පූජා කළ හොත් නැවත පුද්ගලික වශයෙන් පරිහරණය කළ නො හැක.

මේ සියල්ල එකට ගත් විට ගරුභාණ්ඩ විසිපහකි.

## 11.2 ලහු භාණ්ඩ

ලහු භාණ්ඩ යනු සුළු පිරිකර ය. සබන්, පොත්, පෑන්, පැන්සල් ආදී පිරිකර සඟ සතුකොට පූජා කළේ ද සංඝයාගේ විනය කර්මයකින්[36] පසු ව නැවතත් ඒවා පුද්ගලික පරිහරණයෙන් පරිභෝග කළ හැක. ඒවා පුද්ගලීකරණය කළ ද එම සියල්ල භික්ෂූන් සතු වේ. ගිහි පින්වතුන් විසින් ඒවා පරිහරණය කිරීමේ දී භික්ෂූන් වහන්සේලාගේ අවසරය ගෙන ම පරිභෝග කරන්නේ

36 සඟසතු පිරිකර බෙදීම පිණිස සංඝයා එකතු වී පුද්ගලික ව පාවිච්චිය සඳහා අවසර ගැනීමේ ක්‍රියා පටිපාටිය

නම් යෝග්‍ය වේ.

මෙම දෙකොටසින් ගරුභාණ්ඩ පුද්ගලීකරණය නො කළ හැකි නිසා ගිහි පින්වතුන් ඒවා පරිභෝග කිරීමේ දී වඩාත් සැලකිලිමත් විය යුතු ය.

## 11.3 සඟසතු දේපල පරිභෝගය

සඟසතු සේනාසනයක් තුළ ඇති ගස්වැල් පවා සඟසතු දේපල ය. එසේ හෙයින් සඟසතු සේනාසන සහ පන්සල් ආදියෙන් පැල ගලවා ගෙන ඒම, මල්ගෙඩිකැඩීම, දරකැඩීම ආදියෙන් සඟසතු දේපල විනාශ කිරීම හා සමාන අකුසලයකට පත් වේ. සඟසතු දේපල විනාශ කිරීම යනු සුළු අකුසලයක් නොවේ. එසේ හෙයින් ඒ ගැන විමසිලිමත් විය යුතු ය.

සඟසතු සෙනසුන් තුළට යෑමේ දී පාවහන් සහිත ව යෑම, පය නො සෝදා යෑම, තෙත් පයින් යෑම ආදී සෙනසුන් අපවිත්‍ර වන, විනාශ වන දේ නිසා ද අකුසල් විය හැකි බව මතක තබා ගත යුතු ය.

## 11.4 අපවත් වූ භික්ෂුවකගේ පිරිකර

භික්ෂූන් වහන්සේ නමක් අපවත් වූ පසු ඒ භික්ෂුව සතු සියලු ම පිරිකර සඟසතු වේ. ඒවා පුද්ගලික වශයෙන් ගැනීමට කිසිම භික්ෂුවකට වුව ද හැකියාවක් නැත. එසේ ම ඒ භික්ෂූන් වහන්සේගේ ඥාතීන්ට වුව ද අයිතියක් කිව නො හැක. ඒ පිරිකර පුද්ගලික ව ගන්නේ නම් සංඝයා විසින් එකතුව විනයකර්මයක් කිරීමෙන් පසු ඒවා පුද්ගලික වශයෙන් පරිභෝග කළ හැක. භික්ෂුවක් අපවත් වූ පසු ඒවාට අයිතිකරුවෙක් නැත යැයි ඇතැමෙක් සිතා ඒවා පරිභෝගයට ගනිති. එවැනි අවස්ථාවල දී ඒ පිරිකර සඟසතු බැවින් පරිස්සම් විය යුතු ය. එම භික්ෂුව අපවත්වීමට පෙර යම් කෙනෙකුට

යමක් පූජා කළා නම් ඒ පිරිකර අන් අය සතු බැවින් ඒවා සඟසතු නොවේ. ඒවා ඒ අයට පුද්ගලික වශයෙන් පරිභෝග කළ හැක.

# 12. වස් ආරාධනය සහ කඨිනය සම්බන්ධයෙන් දත යුතු කරුණු

## 12.1 වස් ආරාධනාව

වස් ආරාධනය කරන ගිහිපින්වතුන් විසින් එය තේරුම් ඇතිව ම කළ යුතු ය. මේ එහි පිළිවෙත යි. වස් ආරාධනය කරන්නේ ඇසළ පුර පසළොස්වක පොහොයට පෙර දිනයේ ය. (මෙය මෙකල චාරිත්‍රයක් ලෙස එදිනට වස් ආරාධනා කළ ද වස් වැසීමට පෙර කවර දිනක වුව ද වස් ආරාධනාව කළ හැක.) එදින වස් ආරාධනා කරන ස්ථානයට ගොස් ස්වාමින් වහන්සේලාට “මෙම තුන්මාසය තුළ ගුණ පුරාගැනීම සඳහා මෙම සේනාසනයේ වස් සමාදන් ව ගත කරන සේක්වා. මේ කාලය තුල ඔබ වහන්සේලාගේ අඩුපාඩු අවශ්‍යතා ඇත්නම් මට දන්වන සේක්වා. මම හැකි අයුරින් එම අවශ්‍යතාවයන් සපුරන්නෙමි” කියා වස් ආරාධනය කළ යුතු ය.

වස් වැසීමට ආරාධනා කිරීමට පළමුවෙන් එම සේනාසනයට ගොස් මේ තුන්මාසය තුළ සෙනසුනේ වාසය කරන භික්ෂූන් වහන්සේලාට දුකක් කරදරයක් නැති ව එම කුටි තුළ වාසය කිරීමට සුදුසු ආකාරයකට ඇත්දැයි විමසා බැලිය යුතු ය. එසේ අපහසුකම් ඇත්නම් හැකි අයුරින් ඒවා පිළිසකර කළ යුතු ය. උදාහරණයක් ලෙස වහලයෙන් වතුර කාන්දු වන්නේ නම් එවැනි තැන් පිළිසකර කළ යුතු ය. එවැනි දෑ වස් වැසීමට පළමු ව කළ යුතු දේවල් වන අතර කඨිනයට

පෙර කළ යුතු දේවල් නොවේ. වස් ආරාධනා කරන භික්ෂූන් වහන්සේලාට පහසුවෙන් එම තුන්මස තුළ ගුණ පුරාගැනීමට හැකි වන සේ කටයුතු කිරීම දායකයාගේ පරම යුතුකමකි. එම දායකතුමා හට ඒ සඳහා කාලය නැත්නම් එයට වෙනත් කෙනෙකු යොදා හෝ ඒවා සම්පූර්ණ කරවිය යුතු ය.

එසේ වස් ආරාධනා කිරීමේ දී චාරිත්‍රයක් ලෙස වැසි සළුවක් පූජා කරයි. වැසි සළුව යනු භික්ෂූන් වහන්සේලා පැන්පහස[37] වන අවස්ථාවේ දී පාවිච්චියට ගත හැකි රෙදි කඩකි. එම රෙදි කඩ රියන් පහමාරක් පමණ දිග ඇති දුහුල් නැති එකක් වීම යෝග්‍ය ය. එවැනි රෙදි කඩක් සොයා ගැනීමට අපහසු නම් අඳනයක් හෝ පූජා කිරීම සුදුසු ය. එසේ වැසි සළු පූජා කර වස් ආරාධනා කළ පසු එම දායකයා සම්පූර්ණ කළ යුතු වත්-පිළිවෙත් රැසකි.

## 12.2 වස් ආරාධනයෙන් පසු කළ යුතු වත්පිළිවෙත්

වස් ආරාධනා කළ සේනාසනයේ යම් භික්ෂුවක් ගිලන් වුව හොත් එම භික්ෂුවගේ කටයුතු නො පිරිහෙළා ඉටු කළ යුතු ය. යම් දිනයක දානය අඩු පාඩු ඇත්නම් ඒ දින බලා දිනපතා නො අඩු ව දන් ලැබෙන ආකාරයට සකස් කළ යුතු ය. නැත්නම් අඩු දිනයට එම දායකතුමා හෝ දානය රැගෙන යා යුතු ය. එම වස් කාලය තුළ විදුලිය, ජලය ආදිය ද භික්ෂූන්ට පීඩාවක් නොවන සේ ලබා දීමට උත්සාහ කළ යුතු ය. එවැනි භික්ෂූන්ගේ කුදුමහත් අත්‍යවශ්‍ය කටයුතු සම්පූර්ණ කිරීමට දායකතුමා සැදී පැහැදී සිටිය යුතු ය.

37 ස්නානය කිරීම

සැලකිය යුතු කරුණක් නම් එවැනි කටයුතු වස් ආරාධනය කළ දායක තුමන්ට ම පැවරෙන කරුණක් නොව එම සේනාසන ඇසුරු කොට වාසය කරන සියලු ම දෙනාගේ යුතුකමකි. බොහෝ දෙනා සිතන්නේ වස් ආරාධනා කළ දායකතුමන් ම ඒ සියලු දේ කළ යුතු බව යි. එසේ නොව එම කටයුතු සියලු දෙනා ම නො පිරිහෙළා සම්පූර්ණ කළ යුතු ය. එසේ කිසිවෙක් සිදු නො කරන්නේ නම් ඒවා වස් ආරාධනය කළ දායකතුමන් කළ යුතු ය.

## 12.3 කඨින චීවර පූජාව

මෙසේ වස් තුන්මස ගත වීමෙන් පසු මීළඟට කළ යුත්තේ කඨින චීවරය පූජා කිරීම යි. කඨිනය යනු කිසි ම බලාපොරොත්තුවකින් තොර ව භික්ෂූන් වෙත ලැබිය යුතු දෙයකි. වස් සමාදන් වූ සේනාසනයේ පෙරවස් සමාදන් වූ භික්ෂූන්හට එම සේනාසනයේ කඨිනය සංවිධානය කළ නො හැක. “කඨින චීවරය මෙසේ විය යුතු යි, මේ පාට විය යුතු යි, ප්‍රමාණය මෙය විය යුතු යි” කියා සංවිධානයක් කිරීමට එම සේනාසනයේ භික්ෂුවකට නො හැක. නමුත් දායකයා කඨිනය පිළිබඳ විමසීමේ දී භික්ෂුවට කඨිනය පිළිබඳ පැහැදිලි කිරීමක් කළ හැක. චීවරයේ ප්‍රමාණය, පැහැය, රෙදි වර්ගය ආදී කුදුමහත් සියලු කාරණා පිළිබඳ ව දායක පිරිසගේ විමසීමෙන් ම භික්ෂුවට කිව හැක. එසේ ම එම සේනාසනයේ පින්කමක් පැවැත්වීමට නියමිත නම් ඒ සඳහා සෙනසුනේ භික්ෂූන්ගෙන් කරුණු විමසීම සහ එය සංවිධානය කළ යුතු ආකාරය ද භික්ෂූන් වහන්සේගෙන් විමසා දැනගත හැක. යම් හෙයකින් එම සෙනසුනේ එක් භික්ෂුවක් හෝ විමසීමකින් තොර ව කඨින චීවරය සංවිධාන කිරීමෙහි ලා අවවාද කළේ නම්

එම කඨින චීවරය එම සෙනසුනේ සියලු ම භික්ෂූන් වහන්සේලාට අකැප වේ.

## 13. වන්දනා කිරීම පිළිබඳ දත යුතු කරුණු

භික්ෂූන් තවත් භික්ෂුවකට වන්දනා මාන කළ යුත්තේ වැඩිහිටි පිළිවෙළට ය. භික්ෂූන් වහන්සේලාගේ වැඩිහිටි පිළිවෙළ ගණන් ගැණෙනුයේ වයසට අනුව නොව එම භික්ෂූන් වහන්සේලාගේ උපසම්පදාව ලබන ලද දිනය අනුව ය. භික්ෂූන් දානයකට, පිරිතකට ආදී පින්කමක් හෝ පිණ්ඩපාතාදිය සඳහා වැඩම කරන්නේ එම වැඩිහිටි පිළිවෙළට ම ය. ගිහි පින්වතුන් භික්ෂූන් වහන්සේලාට වන්දනා කිරීමේ දී භික්ෂූන් වහන්සේලාගේ වැඩිහිටි පිළිවෙළ දන්නේ නම් එම පිළිවෙළට වන්දනා කිරීම යෝග්‍ය වේ. එයින් අන් භික්ෂූන් වහන්සේලා අපහසුතාවයට පත් නොවේ. නො දන්නේ නම් අසා දැන ගෙන ම වන්දනා කිරීම මැනවි.

සියලු ම දෙනා බුදුරජාණන් වහන්සේට, ධර්ම රත්නයට, සංඝ රත්නයට වන්දනා කරන විට නොයෙක් ආකාරයට වන්දනා කරති. නමුත් නිවැරදි ක්‍රමය වන්නේ පසඟ පිහිටුවා වන්දනා කිරීම යි. එනම් දණහිස් දෙක, වැලමිටි දෙක සහ නළල යන පස් ස්ථානයන් බිම ගැටෙන සේ තබා වන්දනා කිරීම යි. එසේ වන්දනා කිරීමෙන් ඔබේ කුසලය ඇඩි කරගත හැක. ඒ ආකාරයෙන් ම සංඝයා වහන්සේලාට වන්දනා කිරීම ද යෝග්‍ය ය. එසේ කිරීම අපහසු කෙනෙක් නම් හැකි අයුරින් වන්දනා කිරීම ද සුදුසු ය. (මෙය විනය සම්බන්ධ දෙයක් නොවන බවත් අවබෝධය සඳහා ම මෙහි ඇතුළත් කළ බවත් සිහිතබාගත යුතු ය.)

පහත දක්වා ඇත්තේ පසඟ පිහිටුවා වන්දනා කරන ආකාරය දැක්වෙන දළ සටහනකි.



### 13.1 වන්දනා නො කළ යුතු අවස්ථා

භික්ෂුවක් දානය වළඳන්නේ නම්, අන් කටයුත්තක යෙදී ඇත් නම්, සයනය කරන්නේ නම්, හෝ වන්දනා කරන බව නො දන්නේ නම් වන්දනා නො කළ යුතු ය. භික්ෂූන් වහන්සේ තමා කෙරෙහි අවධානය යොමු කළ හැකි අවස්ථාවක ම වන්දනා කළ යුතු ය.

## 14. ධර්මශ්‍රවණය සම්බන්ධයෙන් දත යුතු කරුණු

### 14.1 කාන්තාවන්ට ධර්මය දේශනා කිරීම

දැනුම් තේරුම් නැති පිරිමි පුද්ගලයෙකු නැති කාන්තාවන් පමණක් සිටින තැනක භික්ෂුවකට ධර්ම[38] දේශනා කිරීම විනයෙන් ඇකැප ය. බුද්ධ පූජාවක් තැබීම, බුද්ධ වන්දනාවක් කිරීම ආදී සියලු ම ධර්ම දේශනා සම්බන්ධ දෙයක් කිරීමේ දී සැමවිට ම කාන්තාවන් පමණක් සිටීමෙන් භික්ෂුවට ඇවැත් සිද්ධ වේ. ඒ නිසා එවැනි අවස්ථාවකට සම්බන්ධවන කාන්තාවන් දැනුම් තේරුම් ඇති පිරිමි පුද්ගලයෙකු හෝ දරුවෙකු සම්බන්ධකර ගැනීම භික්ෂුවට ආපත්ති නොවී සිටීමට හේතුවක් වේ.

38 මෙහි ධර්මය යනුවෙන් අදහස් කරන්නේ පාළි ත්‍රිපිටක අටුවාව යි.

සමහර අවස්ථාවල දී පන්සලට දානය ගෙනෙන දායකයන් පිරිමි අය නොමැති ව කාන්තාවන් පමණක් පැමිණෙන අවස්ථා ඇත. එවැනි අවස්ථාවක බුද්ධ පූජාව තැබීමේ දී භික්ෂුවට මෙම ගැටලුවලට මුහුණපාන්නට සිදුවන අවස්ථා තිබේ. යම් අවස්ථාවල කාන්තාවෝ භික්ෂූන් ලවා පිරිත් ආදිය කියවා ගැනීමට පන්සලට එති. එසේ පැමිණෙන විට කුඩා පිරිමි අත දරුවන් රැගෙන එති. නමුත් එය ප්‍රමාණවත් නොවේ. දැනුම් තේරුම් ඇති පිරිමියෙක් සමග පැමිණිය යුතු ය. එබැවින් ඒ ගැන ද සැලකිලිමත් විය යුතු ය.

## 14.2 ධර්ම ගෞරවයෙන් දහම් ඇසීම

භික්ෂූන් වහන්සේලා ධර්මය දේශනා කිරීමේ දී ධර්මය ශ්‍රවණය කරන්නන් පිළිපැදිය යුතු කාරණා කිහිපයකි. ඒවා දැනගෙන පිළිපැදීමෙන් භික්ෂූන් වහන්සේලාගේ විනය ආරක්ෂා කිරීමට උපකාරයක් වන්නේ මෙන් ම ධර්ම ගෞරවය ද ඇති කරගෙන කුසල් උපදවා අකුසල් වළක්වා ගත හැකි ය.

භික්ෂුවක් ගිලන්බවක් තොර වූ පාවහන් පැළඳ සිටින කෙනෙකුට ධර්මය දේශනා කිරීම අකැප ය. මෙම සිකපදය පණවා ඇත්තේ ධර්මයට කරන ගෞරවයක් වශයෙනි. යම් කෙනෙක් භික්ෂුවක් ඉදිරියේ ධර්මමය කාරණයක් ගැන සාකච්ඡා කරන්නේ නම් හෝ ධර්මමය ගැටලුවක් ඉදිරිපත් කරන්නේ නම් හෝ පාවහන් ගලවා එසේ කතා කිරීම යෝග්‍ය ය. එවිට භික්ෂූන් වහන්සේට ගැටලුවකින් තොර ව ධර්මය කියා දීමට හැකි ය.

එසේ ම භික්ෂුවක් ගිලන්බවකින් තොර ව නිදාගෙන සිටින අයට ධර්මය දෙසීම, පිරිත් ආදිය කීම නො ගැළපේ. ගිලන්කමක් නොමැති නම් නැගිටිය යුතු ය. අසනීප වී රෝහල්ගත වී සිටින අවස්ථාවක දී ගැටළුවක්

නැත. තව ද කුඩ ඔසවාගෙන සිටින අයටත් ධර්මය දේශනා කළ නො හැක. ඒ අය බණ අසන්නේ නම් කුඩ අකුළා අහකින් තැබිය යුතු ය. ඇකිළූ කුඩය අතේ ඇති අයටත් ධර්මය දේශනා කළ නො හැක. හිස්වැසුම් පැළඳ සිටින, ජටාවක් වැනි රෙද්දකින් හිස වසාගෙන සිටින අයටත් ධර්මය දේශනා කිරීමෙන් ඇවැත් වේ. එවැනි අවස්ථාවල දී හිස් වැසුම් ඉවත් කර ධර්මය සාකච්ඡා කළ යුතු ය. බිම සිට වාහනයක සිටින කෙනාට ද ධර්මය දේශනා කළ නො හැක. ධර්මය දෙසන අසන සියලු ම දෙනා වාහනයේ සිටින්නේ නම් ගැටලුවක් නැත. දේශකයන් බිම සිටින්නේ නම් අසන්නා ද බිමට බැසිය යුතු ය. ධර්ම ගෞරවයෙන් ම ධර්මය සාකච්ඡා කළ යුතු ය. එවිට භික්ෂුව ආපත්තියකට ලක්වන්නේ ද නැත.



ඉහත පින්තූරයේ දැක්වෙන පරිදි හිඳගෙන සිටීම පලක් බැඳගෙන සිටීම යැයි කියනු ලැබේ. එසේ සිටින ගිලන් බවක් නැති පුද්ගලයාට ධර්මය දේශනා කළ නො හැක. අතින් හෝ සිවුරකින් හෝ වෙනත් රෙද්දකින් ආදී දෙයකින් ද මෙසේ පලක් බැඳ සිටින ඒ සියලු දෙනාට

ධර්මය දේශනා කළ නො හැක.

ධර්මය දේශනා කරන විට දී ධර්මදේශකයන් වහන්සේගේ ආසනය අන් අයගේ ආසනයන්ට වඩා උස් විය යුතු ය. එසේත් නැත්නම් සම විය යුතු ය. මිටි ආසනයක සිටින කෙනෙකු උස් ආසනයේ සිටින්නන් සඳහා ධර්මය දේශනා කිරීම ද නො ගැළපේ. එම නිසා සම ආසනය සිට හෝ මිටි ආසනයක සිට ධර්මය ඇසීම කළ යුතු ය. භික්ෂුව සිටගෙන සිටින විටදී ද බිම හෝ අසුනක හිඳගෙන සිටින අයහට ධර්මය දේශනා කළ නො හැකි ය. එබැවින් එවැනි අවස්ථාවක දී ධර්මය සාකච්ඡා කරන්නේ නම් නැගිට ඇසීම හෝ ධර්ම දේශකයානන් හට ද ආසනයක් පැනවීම හෝ මගින් ධර්ම ගෞරවයට හානියක් නොවේ.

එසේ ම පිටුපසින් යන කෙනා විසින් ඉදිරියෙන් යන කෙනාට ද මාර්ගයෙන් පිටත යමින් මාර්ගයේ යන කෙනාට ද ධර්මය දේශනා කිරීම නො මැනවි. එසේ හෙයින් ධර්මය දේශනා කරන්නාට සැමවිට ම මුල් තැන දිය යුතු ය. එය ධර්මයට කරන ගෞරවය යි. ඒ සියලු තැන්හි දී ම ධර්මයට ගෞරවයෙන් සැලකිල්ලෙන් කටයුතු කිරීමෙන් භික්ෂුවට ද ආපත්තියක් වීම වළක්වාගත හැක.

ධර්මය දේශනා කරන සාකච්ඡා කරන ගිහි පින්වතුන් මේ කරුණු සලකා බලා ධර්මය සාකච්ඡා කළ යුතු ය. මේ කරුණු නො පිළිපැදීමෙන් ගිහිපින්වතුන්හට ආපත්තියක් නො වූයේ ද ධර්මයට අගෞරව වීම හේතුවෙන් අකුසලයක් වීමට ඉඩ ඇති බව මතක තබා ගත යුතු ය.

# 15. දන්දීම සම්බන්ධයෙන් දත යුතු කරුණු

දන්දීම පහසු කටයුත්තක් නොවේ. බහුතරයක් දෙනා දන්දීම යනු කුමක්දැයි පවා නො දනිති. දන් දෙනවා යනු දීම සහ අත්හැරීම යන කාර්යයන් දෙක ම සම්පූර්ණ වීමයි. බොහෝ දෙනෙක් දන් දීමෙන් පසුව "මම දීපුවා පරිභෝග කරනවා ද, ඒවා කාටවත් දුන්න ද" යනාදී වශයෙන් සොයා බලයි. එසේ සොයන්නේ දුන් දෙය සම්පූර්ණයෙන් නො දුන් නිසයි. දන් දුන්නා නම් පසු ව ඒ ගැන සොයා බැලීමක් අවශ්‍ය නැත. තවත් සමහරෙක් "මේවා කාටවත් දෙන්න එපා, ඔබ වහන්සේ ම පරිභෝග කළ යුතු යි" යනුවෙන් පවසා දෙති. එසේ දීමෙන් එම පූජාව ලබන ස්වාමින්වහන්සේ එම දෙයෙහි බැඳ ඇමීමක් වැනි ය. එයින් ද ඒ ලබන ස්වාමින්වහන්සේ අපහසුවට පත් වේ. එසේ දන් දීමෙන් වන්නා වූ පින සම්පූර්ණ නො වන බව ද මතක තබා ගත යුතු ය. එම නිසා දන්දෙන පින්වතුන් දානය දීමේ දී හැකියාවක් ඇත්නම් භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතාවයන් හා අඩුපාඩු සොයා බලා භික්ෂූන් වහන්සේලාට ද අපහසුවක් නො වන පරිද්දෙන් දන් දීමට වග බලා ගත යුතු ය.

## 15.1 අටපිරිකර

අටපිරිකරක් යනු පරිෂ්කාර අටක් එක්කොට සාදන ලද එක් පිරිකරකි. එහි තිබිය යුතු පරිෂ්කාර අට නම් දෙපට සිවුර, තනිපට සිවුර, අඳන සිවුර, පාත්‍රය, කරකැත්ත, බඳපටිය, ඉඳිකටු-නූල්, පෙරහන්කඩ යන ඒවා යි.

සිවුරු පාත්‍රා පිළිබඳ මෙම ග්‍රන්ථයෙහි පළමු ව විස්තර කර ඇත. මෙහි කරකැත්ත කෙස් රැවුල් බෑමට

පමණක් ගන්නා දැලි පිහිය යැයි ඇතැමෙක් වරදවා තේරුම් ගෙන ඇත. එම නිසා සමහරෙක් කරකැත්ත වෙනුවට රේසර් යොදා ඇති අවස්ථා ද දැකිය හැක. මෙහි අදහස් කරන කරකැත්ත නම් දැහැටි උල් කිරීමට, කෙස් බෑමට හා කප්පියං කිරීම් ආදිය සඳහා පරිභෝග කළහැකි පිහියකි. අන් පිරිකර වූ බඳපටිය අඩුම තරමින් රියන් පහක්වත් දිග ඇති අඟල් දෙකක්වත් පළල ඇති පටියක් විය යුතුය. එයත් තරබාරු භික්ෂුවක් නම් එයිටත් වඩා දික් විය යුතු ය. ඉඳිකටු ආදිය ද පරිභෝග කළ හැකි තත්ත්වයේ ඒවා දැයි සොයා බැලිය යුතු ය. බොහෝ අටපිරිකරවල ඇති ඉඳිකටු මළ බැඳී ඇති බැවින් පරිභෝග කළ නො හැක. නූල් නම් රෙදි මැසීමට ගන්නා නූල් වේ. පෙරහන් කඩ නම් පැන් පෙරීමට සුදුසු ආකාරයේ පෙරහන්කඩක් විය යුතු ය.

හොඳම ක්‍රමය නම්, කියන ලද පරිෂ්කාරයන් අට වෙන වෙන ම ගෙන එකට පූජා කිරීම යි. විකිණීමට තබා ඇති අටපිරිකරයන්හි බොහෝ අඩුපාඩු තිබීමට ඉඩ ඇත. ඒවා සොයා බලා විනයානුකූල බව නමට පමණක් සීමා නො වන නියම විනයානුකූල අටපිරිකර පූජා කර පින් රැස්කර ගනිත්වා.

## 16. නොමනා ගිහියන්ට බුදුන් වහන්සේ පණවා ඇති දඬුවම

නො හික්මුණා වූ ගිහියන් හික්මවීම පිණිස බුදුන් වහන්සේ පත්තනික්කුජ්ජන[39] කර්මය යැයි දඬුවමක් පණවා වදාළ සේක. එය පළමු කොට පනවන ලද්දේ

39 දානය පිළිගැනීමට නො හැකි වන සේ පාත්‍රය උඩු යටිකුරු කිරීමට භික්ෂුවට අවසරය ලබා දෙන විනයකර්මයකි.

දබ්බමල්ල ස්ථවිරයන් වහන්සේට බොරු චෝදනාවක් ඇති කළ වඩ්ඪ නම් වූ ලිච්ඡවී පුත්‍රයාට ය. ඒ දඬුවම පැමිණවීමට සුදුසු වරද අටක් ඇත්තේ ය. ඒ මෙසේ ය.

1. භික්ෂූන්ට අලාභ කරනු පිණිස උත්සාහ කිරීම.
2. භික්ෂූන්ට අනර්ථ කිරීමට උත්සාහ කිරීම.
3. භික්ෂූන් වහන්සේලාට ආවාසයන්හි නො විසිය හැකි වනු පිණිස උත්සාහ කිරීම.
4. භික්ෂූන්ට ආක්‍රෝශ පරිභව කිරීම.
5. භික්ෂූන් භික්ෂූන් හා බිඳවීම.
6. බුදුන්ගේ අගුණ කීම.
7. ධර්මයේ අගුණ කීම.
8. සංඝයාගේ අගුණ කීම.

පත්තනික්කුජ්ජන යන වචනයේ තේරුම පාත්‍රය මුනින් නැවීම යනු යි. යම්කිසි පුද්ගලයෙක් ඉහත කියන ලද කරුණු අට අතුරෙන් එකක් හෝ කෙළේ නම් එකල්හි සංඝයා රැස් ව කර්මවාක්‍යය කියා ඒ කර්මය කළ යුතු ය. එය කළ පසු ඒ තැනැත්තාහට සියලු ම භික්ෂූන් විසින් පාත්‍රය මුනින් නවන ලද්දේ වේ. එනම් එම පුද්ගලයා දෙන කිසිම දෙයක් පිළිගැනීම කිසිම භික්ෂුවකට තහනම් කටයුත්තක් වේ.

කර්මය කරනු ලැබූ උපාසක තැන නැවත සංවරයෙහි පිහිටා සංඝයාගෙන් සමාව ඉල්ලා සිටිය හොත් නැවත සංඝයා රැස් ව ඒ කර්මය සන්සිඳුව යි. ඉන්පසු ඔහුට නැවත භික්ෂූන්ට සිව්පසය පිළිගැන්වීමට අවකාශ ලැබේ. මෙය නොමනා ගිහියන්ට බුදුන් වහන්සේ පණවා ඇති දඬුවමක් වන සේක.

මෙකල නොමනා ගිහියන්හට මෙම විනයකර්මය නො කළේ ද එවැනි තැන්වලට පිණ්ඩපාතය ආදිය සඳහා යෑම නුසුදුසු ක්‍රියාවක් වේ. මෙකල බොහෝ දෙනා සංඝයාගේ අගුණ කියති. භික්ෂූන් වහන්සේලාගේ දානය වළක්වති. එවැනි ක්‍රියා කිරීමෙන් මෙම විනයකර්මය දීමට සුදුස්සෙක් වේ. විනයකර්මය නො දුන්නේ ද ඔවුහු බොහෝ සෙයින් පවු රැස්කර ගනිති. එම නිසා පින් කැමැත්තෝ එවැනි පාපතර ක්‍රියාවන්ගෙන් වැළකෙත්වා.

මෙසේ කියන ලද්දා වූ කරුණු කාරණා සිහියට ගෙන සංඝෝපස්ථානය මැනවින් සිදු කර නිවන් මග එළි කර ගනිත්වා.

සියලු දෙනාට ම තෙරුවන් සරණ වේවා!